# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT

# 2013

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**விவசயப் பட்டப் பின் படிப்பு நிறுவனம்**
**பேராதனைப் பல்கலைகழகம்**

POSTGRADUATE INSTITUTE OF AGRICULTURE
UNIVERSITY OF PERADENIYA

# වාර්ෂික වාර්තාව - 2013

## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## පේරාදෙණිය විශ්ව විද්‍යාලය



| පටුන | පිටුව |
|---|---|


| | | |
|---|---|---|
| | ආයතනයේ දැක්ම හා මෙහෙවර | i |
| | ආයතනයේ සංවිධාන ව්‍යුහය | ii |
| | කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ | iii |
| **1.** | 2013.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා ආයතනයේ ප්‍රගතිය පිළිබඳ අධ්‍යක්ෂතුමාගේ සමාලෝචන වාර්තාව | 01 |
| | 1.1 හැඳින්වීම | 01 |
| | 1.2 අධ්‍යයන හා පර්යේෂණ කටයුතු | 01 |
| | 1.3 වාර්ෂික සම්මේලනය | 02 |
| | 1.4 සාක්ෂාත් කර ගන්නා ලද ඉලක්ක | 03 |
| | 1.5 මුහුණ දුන් අසමාර්ථතා හා එයට බලපෑ සාධාරණ හේතු | 03 |
| | 1.6 අනාගත සැලසුම් | 03 |
| **2.** | ආයතනික සම්පත් හා සිසුන් පිළිබඳ තොරතුරු | 04 |
| **3.** | විදේශිය සිසුන් පිළිබඳ විස්තර | 06 |
| **4.** | 2013 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සිටි ස්ථිර කාර්ය මණ්ඩලය | 06 |
| **5.** | 2013 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සිටි ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 07 |
| | 5.1 බඳවා ගැනීම් | 07 |
| | 5.2 ආයතනයේ කාර්යය මණ්ඩලය සහභාගි වූ පුහුණු වැඩසටහන් හා වැඩමුළු | 08 |
| **6.** | 2013 වර්ෂයේදී කරන ලද පර්යේෂණ, නව සොයා ගැනීම්, හා ප්‍රකාශන | 10 |
| **7.** | a) 2013 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ ,සමුළු, හා වැඩමුළු | 10 |
| | b) වාර්ෂික පර්යේෂණ සම්මේලනය | 11 |

| | | |
|---|---|---|
| **8.** | a) 2013 වර්ෂයේදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් වැඩමුළු, හා කෙටිකාලීන පාඨමාලා | 13 |
| | b) 2013 වර්ෂයේ දී ආයතනය විසින් සත්කාරකත්වය දරණ ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර | 14 |
| **9.** | 2013 වර්ෂයේදී ආයතනික කාර්ය මණ්ඩලය හා සිසුන් විසින් ලබා ගන්නා ලද සම්මාන | 15 |
| **10.** | 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර | 15 |
| **11.** | සාමාන්‍ය පරිපාලනය | 15 |
| | 11.1 පැරණි ගොඩනැගිලි අලුත් වැඩියා කටයුතු | 15 |
| | 11.2 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය | 16 |
| | 11.3 සුබසාධන හා විනෝද කටයුතු | 17 |
| | 11.4 ආයතනයේ වාර්ෂික චාරිකාව | 18 |
| **12.** | කෘෂි විද්‍යාපීඨ පුස්තකාලයේ වාර්ෂික වාර්තාව | 20 |
| **13.** | ආයතනයේ මූල්‍ය කාර්යය සාධනය | 24 |
| | 13.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 24 |
| | 13.2 මූලධන වියදම් පිළිබඳ විස්තර | 25 |
| | 13.3 ව්‍යවස්ථාපිත හා අනාවරණ වාර්තාව | 26 |
| **14.** | විගණන කමිටු වාර්තාව | 48 |

## දැක්ම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට හා ගෝලීය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම පිණිස කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් අංශයන්හි පශ්චාත් උපාධි හා පර්යේෂණ කටයුතු කිරීමෙහි ලා විශිෂ්ඨත්වයකින් හෙබි කලාපීය මධ්‍යස්ථානයක් බවට පත් වීම.


## මෙහෙවර

පශ්චාත් අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස සිය සේවාව ලබා දෙමින්, උසස් ගුණාත්මක බවින් යුත් ඉගැන්වීම් හා පර්යේෂණ තුළින් අධ්‍යාපනික වශයෙන් උසස් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ පුහුණුවක් ලබා දීම හා කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්ට ධනාත්මක දායකත්වයක් සපයන්නා වූ ප්‍රවීනතාවයෙන් හෙබි සේවයට කැප වූ වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම.

## ඉලක්ක

1) විශිෂ්ටත්වයෙන් හෙබි අධ්‍යයන ප්‍රමිතියක් අත් කර ගැනීම
2) පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල විශිෂ්ටත්වයක් අත්කර ගත් ජාතික හා අන්තර්ජාතික ආයතනයක් ලෙස පිළිගැනීමක් ලබා ගැනීම
3) පර්යේෂණ හා නව්‍යතා සංස්කෘතියක් ඇති කිරීම
4) මූල්‍යමය ශක්‍යතාවයෙන් යුත් ආයතනයක් බවට පත් වීම

## කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ සංවිධාන ව්‍යුහය



**කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය (2013)**

1) මහාචාර්ය බීසී එන් පීරිස් - අධ්‍යක්ෂ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2) ඩග්ලස් නානයක්කාර මහතා - අතිරේක ලේකම් (උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
3) ආචාර්ය ඒ ජේ සතරසිංහ -අධ්‍යක්ෂ ජනරාල්, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (මුදල් අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
4) ආර් එම් ඩී බී මීගස්මුල්ල මයා, ලේකම්, කෘෂිකර්ම අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
5) ලේකම්,වැවිලි කර්මාන්ත අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
6) එච් එල් තිසේරා මයා, ලේකම් - පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය සඳහා
7) කේ ඒ අයි ඩී සිල්වා මයා අධ්‍යක්ෂ ප්‍රතිපත්ති හා සැලසුම් ( පරිසර අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
8) අනුර සතුරුසිංහ මයා - වන සංරක්ෂක - පර්යේෂණ හා අධ්‍යාපන - (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නියෝජනය කිරීම සඳහා)
9) ආචාර්ය ජේ ඩී සමරසිංහ - සභාපති (කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව CARP)
10) ආචාර්ය රොහාන් විජේකෝන් - අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
11) ආචාර්ය ඩී ආර් ටී පී රත්නායක මයා- අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
12) එන් කේ ඒ රූපසිංහ මයා - අධ්‍යක්ෂ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
13) ආචාර්ය එච් ඒ ජේ ගුණතිලක - අධ්‍යක්ෂ පොල් පර්යේෂණ ආයතනය
14) මහාචාර්ය කේ සමරසිංහ - පීඨාධිපති කෘෂිකර්ම විද්‍යාපීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
15) මහාචාර්ය එස් සුබසිංහ - පීඨාධිපති කෘෂිකර්ම පීඨය රුහුණු විශ්ව විද්‍යාලය
16) ආචාර්ය ඒ ඩී අම්පිටියවත්ත - පීඨාධිපති කෘෂිකර්ම පීඨය සබරගමුව විශ්ව විද්‍යාලය
17) මහාචාර්ය ඩී බී ටී එස් පී අත්තනායක - පීඨාධිපති කෘෂිකර්ම පීඨය වයඹ විශ්ව විද්‍යාලය
18) ආචාර්ය එම් ජී ටී එස් අමරසේකර - පීඨාධිපති කෘෂිකර්ම පීඨය රජරට විශ්ව විද්‍යාලය
19) ආචාර්ය පී සිවරාජා- පීඨාධිපති කෘෂිකර්ම පීඨය නැගෙනහිර විශ්ව විද්‍යාලය
20) ආචාර්ය එස් සිවචන්ද්‍රන්- පීඨාධිපති කෘෂිකර්ම පීඨය යාපනය විශ්ව විද්‍යාලය
21) මහාචාර්ය එච් බී එස් ආරියරත්න - පීඨාධිපති පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
22) මහාචාර්ය වී ඒ සුමණසිංහ - කෘෂිකර්ම ජීව විද්‍යාව පිලිබඳ අධ්‍යයන මණ්ඩලය
23) මහාචාර්ය එච් එල් ජේ වීරහේවා - කෘෂි ආර්ථික විද්‍යාව පිලිබඳ අධ්‍යයන මණ්ඩලය
24) මහාචාර්ය ඊ ආර් එන් ගුණවර්ධන - කෘෂි ඉංජිනේරු විද්‍යාව පිලිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
25) ආචාර්ය එච් වී ඒ වික්‍රමසූරිය - කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
26) මහාචාර්ය එච් ඩබ්ලිව් සිරිල් - සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
27) ආචාර්ය ජී එල් පීරිස් - ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
28) ආචාර්ය ශාමලා කුමාර් - ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
29) ආචාර්ය එච්එම් පී එස් බී හිටිනායක - බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
30) මහාචාර්ය ඩී ජී එන් ජී විජේසිංහ - ආහාර විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
31) ආචාර්ය ඩී එම් ද කොස්තා - පැළෑටි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
32) මහාචාර්ය ඒ එන් ජයකොඩි - පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද නියෝජිතයන්**

33) මහාචාර්ය ආර් පී ද සිල්වා -
34) ආචාර්ය එස් එස් ඊ රණවන
35) ආචාර්ය ඩී බී ටී විජේරත්න මයා
36) මහාචාර්ය එස් කේ පින්නවල
37) මහාචාර්ය බී එස් බී කරුණාරත්න

## 1. 2013.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා ආයතනයේ ප්‍රගතිය පිළිබඳ අධ්‍යක්ෂතුමාගේ සමාලෝචන වාර්තාව (මහාචාර්ය බී. සී. එන් .පීරිස් මහතා විසින් ඉදිරිපත් කරන ලද පරිදි)

### 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 9 දරණ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පණත මගින් 1979 වර්ෂයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධව ස්ථාපනය කරන ලදි . කෘෂිකර්මයට අයත් විවිධ විෂය ක්ෂේත්‍ර , කෘෂිකර්ම අමාත්‍යංශය., පශු සම්පත්., පරිසර හා වන සම්පත්, වැවිලි කර්මාන්ත , උසස් අධ්‍යාපන, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය යනාදී අමාත්‍යංශ නියෝජනය කරන්නා වූ සුවිශේෂී පුද්ගලයන්ගෙන් සැදුම්ලත් කළමනාකරණ මණ්ඩලයක් වෙත ආයතනයේ පාලනය පවරනු ලැබ ඇත . පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළම අවශ්‍යය අවකාශ සැලසීම හා රටේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා මනාව පුහුණු කරන ලද විද්‍යාත්මක දැනුමෙන් අනූන වෘත්තිකයින් බිහි කිරීම මෙම ආයතනය ස්ථාපනය කිරීමේ පරම අභිලාසය විය. බලාපොරොත්තු වූ පරිදි මෙම ආයතනය අඩසියවසකට අඩු කාලයක් තුළ දී ජාතික අවශ්‍යතා සපුරාලීමට සමත් වී ඇති අතර, පරිසර දූෂණය, ආහාරවල සෞඛ්‍යය ආරක්ෂිත බව (Food safety) ආහාර සුරක්ෂිතතාව (Food security), හා ජෛව විවිධත්වය යනාදිය හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ මතුව තිබෙන නව අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය නව උපක්‍රම සොයා ගනිමින් සිටියි.

### 1.2 අධ්‍යයන හා පර්යේෂණ කටයුතු

ඉතා ශක්තිමත් හා මනා පලපුරුද්දෙන් යුත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයක සහය ඇතිව කෘෂිකර්ම පීඨයේ සහ මෙම ආයතනය සතුව ඇති නවීනතම පහසුකම්වලින් යුත් රසායනාගාර, තොරතුරු තාක්ෂණාගාර, පුස්තකාල හා දේශනශාලා යනාදිය භාවිත කරමින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාපීඨයේ ද වෙනත් විශ්ව විද්‍යාලවල පෞද්ගලික ආයතනවල හා අදාල වෙනත් සංවිධානවල සුදුසුකම්ලත් විශේෂඥයින්ගෙන් සැදුම්ලත් බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් විසින් දේශන පවත්වනු ලැබේ. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥතාවයන්ගෙන් හෙබි 300 දෙනෙකුට අධික බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් විසින් අධ්‍යයන මන්ඩල 11ක් හරහා අදාළ ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලැබේ. මෙම ආයතනය විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා දෙකක් ඇතුළත්ව වර්තමානයේ උපාධි පාඨමාලා 31 ක් පිරිනමනු ලබන අතර ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති උපාධිය(M.B.A), දර්ශනපති උපාධිය(M.Phil), හා දර්ශනශූරී උපාධිය හා ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දර්ශනශූරී උපාධිය ඇතුළුව පශ්චාත් උපාධි පාඨමාලා 26ක් පවත්වනු ලැබේ. මෙම ආයතනයට වාර්ෂිකව සිසුන් 400 -450 අතර ප්‍රමාණයක් බඳවා ගනු ලබන අතර, මෙහි විවිධ ජාතීන්ට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 2000 ක් පමණ අධ්‍යයන කටයුතුවල නිරත වෙති. **"සාමාන්‍ය තත්වයට වඩා විවෘතය"** යන පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය තේමා පාඨයට අනුව බඳවා ගනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සිටින සෑම අංශයකම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සමන්විත වේ. විමර්ශනයට භාජනය වී ඇති කාල සීමාව තුළ පහත සඳහන් පරිදි අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 431 දෙනෙකු ලියාපදිංචි කරනු ලැබ ඇත .

- 328 - අධ්‍යයන මණ්ඩල 11ක් විසින් පවත්වනු ලබන විවිධ විද්‍යාපති උපාධි පාඨමාලා 23ක් සඳහා
- 45 - ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව සඳහා
- 31 - දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා
- 04 - දර්ශන ශූරී උපාධි පාඨමාලාව සඳහා

පහත සඳහන් පරිදි සිසුන් 272 ක් සිය පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කර ඇත .

විද්‍යාපති (M.Sc) - 204 , ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති(MBA) - 36 ,
දර්ශනපති (M.Phil) - 22 දර්ශනශූරී (Ph.D) - 06

රටේ ජාතික අවශ්‍යතා කෙරෙහි ප්‍රායෝගිකව අවධානය යොමු කරමින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය අධ්‍යයන හා පර්යේෂණ පදනම තවදුරටත් සඵලදායී බවට පත් කරමින් හා ශක්තිමත් කරමින් සිටී. විමර්ෂණයට භාජනය වී ඇති කාල සීමාව තුළ ඉහත කී ඉතා සුවිශේෂී වැදගත්කමකින් යුත් කාර්යයන් සපුරා ගැනීම සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන්ට සම්බන්ධ විශේෂඥයින්ගේ සහභාගිත්ව ක්‍රියාවලියක් තුළින් සියලුම අධ්‍යයන මණ්ඩලවල සමස්ථ විෂය මාලා (curriculum) සංශෝධනය කරන ලදී. මෙයට අමතරව එසේ සංශෝධනය කරන ලද විෂය මාලා ඇතුළත්කොට සියලුම පාර්ෂවකරුවන්ගේ සක්‍රිය දායකත්වය ඇතිව 2013/14 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය කණ්ඩායමට ලබා දීම සඳහා නව ශිෂ්‍ය අත්පොතක් මුද්‍රණය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස නව පශ්චාත් උපාධි පාඨමාලා දෙකක් හඳුන්වා දීමට සැලසුම්කොට ඇත් අතර උපාධිධාරී ශ්‍රම බලකායේ තත්වය වැඩිදියුණු කිරීමට හා රැකියා විරහිත උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම පිණිස නව පාඨමාලා ඒකක බොහොමයක් හඳුන්වා දුන් අතර, දැනට පවතින විෂය මාලාවට නවීකරණය කරන ලද පාඨමාලා ඒකක ඇතුළත් කරන ලදී.

### 1.3 වාර්ෂික සම්මේලනය

පර්යේෂණ තුළින් ලබා ගත් නව දැනුම පිළිබඳ සාකච්ඡා කිරීමට, එය බෙදාහදා ගැනීමට හා එකී දැනුම ව්‍යාප්ත කර හැරීම සඳහා දේශීය හා විදේශීය පර්යේෂකයින්, ආයතනයේ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට වේදිකාවක් වන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සම්මේලනය, එහි ආයතනික දින දර්ශනයේ සුවිශේෂී දිනයක් වේ. විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය සුවිශේෂී වර්ෂයක් බවට පත් වී ඇත්තේ එකී සම්මේලනය 2013 වසරේදී රිදී ජුබිලිය සැමරූ බැවිනි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ නිත්‍ය නියෝජිත බෙත් එස් ක්‍රෝෆෝර්ඩ් මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙය ඉතා උත්කර්ෂවත් ලෙස 2013 නොවැම්බර් 20 -22 යන තෙදින තුළ මහනුවරදී පවත්වන ලදී .

මෙහිදී මෙම ආයතනයේ හා ඔස්ට්‍රේලියාව, කැනඩාව, හා ඉන්දියාව යන රටවලින් පැමිණි පර්යේෂකයින් විසින් පෝස්ටර් ඉදිරිපත් කිරීම් ( poster presentations) 10 ක් ද ඇතුළත්ව ඉදිරිපත් කිරීම් 55 ක් සිදු කරන ලදී. එකී සම්මේලනයේදී තේමා 12 ක් යටතේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ 12 දෙනෙකු හට තිළිණ ප්‍රදානය කරන ලදී. මෙයට අමතරව ආයතනයේ හා වාර්ෂික සම්මේලනයේ උන්නතිය සඳහා සුවිශේෂී දායකත්වයක් දැක්වූ ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරු හා පසුගිය වාර්ෂික සම්මේලනවල සම්බන්ධීකාරකවරු ඇගයීමට ද මෙය අවස්ථාවක් කොට ගන්නා ලදී.

## 1.4 සාක්ෂාත් කර ගන්නා ලද ඉලක්ක

1981 වර්ෂයේදී ගොඩ නගන ලද මෙම ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල අලුත් වැඩියා කරන ලදී . මෙහිදී ආයතනය සතුව තිබූ දේශන ශාලා සංඛ්‍යාව 13 සිට 17 දක්වා වැඩි කරන ලද අතර, එම දේශන ශාලා සඳහා නවීනතම පහසුකම් සපයන ලදී. කථිකාචාර්ය මණ්ඩලය හා සිසුන් යන දෙපිරිසටම සිය ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පහසුවෙන් කරගෙන යා හැකි පරිදි හා ආයතනයේ බලධාරීන්ට නියමිත වෙලාවට නිසි තීරණ ගැනීමට ද සිය කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවහා සඵලතාව ඉහළ නැංවීම පෙරදැරිකොට ගෙන අන්තර්ජාලය පදනම් කොටගත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (Management information system) ස්ථාපනය කරන ලදී. රජය විසින් වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන ආයතනයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී ලෙද යොදා ගෙන ඇත . පාඨමාලා ගාස්තු අය කර ගැනීම සඳහා භාවිත කරන ලද ක්‍රමවේදයන් හා ගෙවීම් සම්බන්ධ අඛණ්ඩ සොයා බැලීම් හේතු කොට ගෙන පෙර වසරවල් හා සසඳන කල එකී අයකර ගැනීම් කටයුතුවල අතිවිශාල වර්ධනයක් (80%) වාර්තා වී ඇත .

ස්ථාවර වත්කම් ලේඛනය කෙටුම්පත් කිරීමේ කටයුතු බොහෝමයක් අවසන් අදියරේ පවතින අතර, දශක කිහිපයක් තිස්සේ පැන නැගී තිබූ විගණන විමසුම් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු කිරීමට ප්‍රාරම්භයන් කීපයක් ගෙන ඇත . තුන්වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරු 1ක් හා කම්කරු තනතුරු 03ක් වශයෙන් පැවති තනතුරු ඇබෑර්තු 04ක් පිරවීමට පියවර ගෙන ඇත . මෙයට අමතරව පූර්ණ කාලීන අධ්‍යයන උපදේශකවරුන් (Tutors) හා ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු බඳවා ගැනීමෙන් අධ්‍යයන මණ්ඩලවල ඉගැන්වීමේ කටයුතු සඳහා පහසුකම් සලසා ඇත. එසේම සේවක මණ්ඩලය සඳහා නව රියදුරු තනතුරක් ඇති කිරීමට අනුමැතිය ලැබී ඇත .

## 1.5 අසමාර්ථතා හා එයට බලපාන ලද හේතු

විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ කැපී පෙනෙන අසමාර්ථතා වාර්තා වී නොමැත. කෙසේ වුවද දරණ ලද ප්‍රයත්නයන් අනුව බලන කල වාර්ෂිකව බඳවාගනු ලබන දේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීමට නොහැකි වී ඇති අතර, අතරමගදී පාඨමාලා හැරයන ශිෂ්‍ය සංඛ්‍යාව පහත හෙලීමට නොහැකි වී ඇත. එසේම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන්නද බලාපොරොත්තු වූ පරිදි විදේශ සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීමට නොහැකි වී ඇත. රටේ මධ්‍ය ප්‍රදේශයේ සිට බලන කළ මෙම ආයතනය ඉතා දුර බැහැරව පැවතීමත්, විදේශීය සිසුන් සඳහා නේවාසික පහසුකම් නොමැවීමත් ඉහත ගැටලුවට බලපාන ලද හේතු වශයෙන් දැක්විය හැකිය. තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටිවලට අනුකූලව තනතුරු ඇබෑර්තු පිරවීමට කටයුතු කිරීමේදී අදාළ තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගේ හිඟයක් පැවති බැවින් එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය.

## 1.6 අනාගත සැලසුම්

ප්‍රධානතම අනාගත සැලසුම වන්නේ ආයතනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2014 වසරේ සිට ලංකා තත්ව සහතික රාමුව(Sri Lanka Quality Assurance Framework ) ප්‍රකාරව ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රතීතනය(accreditation) ලබා ගැනීමට ප්‍රාරම්භයන් ගෙන තිබේ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය හා ඝානාවේ යෙශුආ තාක්ෂණ ආයතනය

(Yeshua Institute of Technology) ආයතනය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමකට අනුව 2014 මාර්තු මාසය වන විට අදාල අධ්‍යයන මණ්ඩලය විසින් ජීව සංඛ්‍යානය (Bio-Statistics) පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාවක් මෙරටින් බැහැරව පැවැත්වීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. මෙම වැඩසටහන යටතේ ආරම්භයේදී මෙම වැඩසටහන සඳහා ඝානාවෙන් හා ඒ ආශ්‍රිත රටවලින් සිසුන් විසි දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කරන අතර, කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය එකී පාඨමාලාව සඳහා දී ඇති අධ්‍යයන දින දර්ශනය අනුව ඝානාවට ගොස් දේශන පැවැත්වීමට නියමිය. දැනට වෙළඳපොලේ පවතින මිල ගණන් සැලකිල්ලට ගෙන පාඨමාලා ගාස්තු වැඩි කිරීමට ආයතනය බලාපොරොත්තු වෙයි. මීට අමතරව රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කමිටුව(COPE) නිර්දේශ කළ පරිදි මෙම ආයතනය විසින් විශේෂයෙන් ආහාර පිළිබඳ පර්යේෂණ කරගෙන යාම සඳහා මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීමට නියමිත අතර, පළමුව එය කොළඹ කේන්ද්‍ර කර ගනිමින් ස්ථාපිත කිරීමට නියමිතය. පසුව එහි සාර්ථකත්වය සලකා බලා අනෙක් රසායනාගාරය කිලිනොච්චියේ ස්ථාපිත කිරීමට නියමිතය. මීට අමතරව ආයතනය සඳහා බඳවා ගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමටද එම සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු ගොඩනැගිල්ලක් පවරා ගැනීමට ද ඉදිරියේදී පියවර ගනු ලැබේ. මෙම සෑම ප්‍රයත්නයකින්ම අපේක්ෂාකරනු ලබන්නේ ආයතනයේ 2014 -2017 සංයුක්ත සැලැස්මේ සඳහන් එහි ප්‍රධාන අරමුණු වලින් එකක් වන මූල්‍යමය ශක්‍යතාව සාක්ෂාත් කර ගැනීමයි.

## 2. ආයතනය සතු සම්පත් හා ලියා පදිංචි වී සිටින සිසුන් පිළිබඳ විස්තර -2013

| පාඨමාලාව | මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්ය මණ්ඩල සංයුතිය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි) | | | |
|---|---|---|---|---|---|
| | | අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යයන සහායේ කාර්ය මණ්ඩලය | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | 02 | 43 | 01 | **46** |
| **විද්‍යාපති (M.Sc)** | **408** | | | | |
| **දර්ශනපති (M.Phil)** | | | | | |
| **දර්ශන ශූරී (PhD)** | | | | | |
| | | | | | |
| එකතුව | **408** | **02** | **43** | **01** | **46** |


2013 දෙසැම්බර් 31 දිනට ආයතනය සතුව පැවති සම්පත් හා ලියාපදිංචි වී සිටි සිසුන් පිළිබඳව තොරතුරු ඉහත සඳහන් වගුවේ ඇතුළත් වේ. විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ විවිධ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් 408 දෙනෙකු ලියා පදිංචි වී ඇති අතර, ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය විසින් මේ අය සඳහා අවශ්‍ය සේවය සපයමින් සිටියි.


පෙර වසරවල් හා සසඳන කල සිසුන් ලියා පදිංචි කිරීම හා සම්බන්ධ ගැටළු නොතිබුණු බැවින් 2013 වසරේදී වඩා ඉහළ ශිෂ්‍ය ලියාපදිංචින් වාර්තා වී තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඇබෑර්තු වී පැවති තනතුරු 8න් එක් මහාචාර්ය තනතුරක් සඳහා තාවකාලිකපදනම මත බඳවා ගන්නා ලද අතර පෙර බඳවා ගන්නා ලද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයාගේ හා අධ්‍යයන උපදේශකවරයාගේ සේවය ද ලබා ගන්නා ලදී. ආයතනය සඳහා එකී තනතුරුවල ඉඳවා ගැනීමේ අවශ්‍යතාව මතු වූ බැවින් එම තනතුරු සඳහා බඳවා ගන්නා ලදී. විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ අනධ්‍යයන සේවක මණ්ඩලයට අයත් මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු පිරවීමට පියවර ගෙන ඇත .

| ආයතනය | අධ්‍යයන වැඩසටහන | 2013 වර්ෂය සඳහා බඳවා ගැනීම් | 2012 වර්ෂය සඳහා බඳවා ගැනීම් | 2013 වර්ෂයේදී පිරිනමන ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමා |
|---|---|---|---|---|
| කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | 10 | 04 |
| | විද්‍යාපති (M.Sc) | 328 | 03 | 204 |
| | ව්‍යාපාර අධ්‍යයන විද්‍යාපති (M.B.A) | 45 | 03 | 36 |
| | දර්ශනපති (M.Phil) | 31 | 03 | 22 |
| | දර්ශන ශූරී (PhD) | 04 | 14 | 06 |
| | casual | - | 02 | - |
| | **එකතුව** | **408** | **35** | **272** |

2013 වර්ෂයේදී එක් එක් අධ්‍යයන පාඨමාලා සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව හා පිරිනමන ලද පශ්චාත් උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිළිබඳ විස්තර ඉහත වගුවේ දැක්වේ. පෙර වසර හා සසඳන කළ 2013 වර්ෂයේදී අධ්‍යයන පාඨමාලා සඳහා බඳවාගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවේ වැඩි වීමක් දක්නට ලැබේ.

2012 වර්ෂයේදී මාස 04කට වැඩි කාලයක් සමස්ථ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ විටින් විට අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල විසින් ගන්නා ලද වෘත්තිය සමිති ක්‍රියාමාර්ග එකී වර්ෂයේදී බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව සීඝ්‍ර ලෙස පහත වැටීමට ඍජුවම බලපා තිබේ. 2013 වර්ෂය සඳහා ලියා පදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ හා උපාධි පිරිනමන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අතර ඍජු සම්බන්ධතාවක් නොමැත . මක් නිසාද යත් එම වර්ෂයේදී පශ්චාත් උපාධි පිරිනමනු ලැබ ඇත්තේ 2008, 2006, හා 2003 වර්ෂවල ලියාපදිංචි වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහාය. කෙසේ වුවද පෙර වසරවල් දෙක හා සසඳන කළ විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ පාඨමාලා සඳහා ලියා පදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ හා උපාධි පිරිනමන ලද ශිෂ්‍ය සංඛ්‍යාවේ කැපී පෙනෙන වැඩි වීමක් දක්නට ලැබේ.




ඉහත දක්වා ඇති ප්‍රස්ථාර දෙකෙන් විමර්ශනයට භාජනය වී ඇති වර්ෂයේදී පාඨමාලා සඳහා ලියා පදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව දැක්වේ. පෙර වසරවල් හා සසඳන කළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැර අනෙකුත් අධ්‍යයන පාඨමාලා සඳහා ලියා පදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ සුළු වැඩි වීමක් දක්නට ලැබේ. ජීව සංඛ්‍යානය(Bio –Statistics) විෂය සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියා පදිංචි වී නොසිටි බැවින් 2013 වර්ෂයේදී එම විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව නොපවත්වන ලදී.

## 03. විදේශීය සිසුන් පිළිබඳ විස්තර

| අධ්‍යයන වැඩසටහන | 2013 වර්ෂය සඳහා බඳවා ගැනීම් | 2012 වර්ෂය සඳහා බඳවා ගැනීම් | 2013 දී උපාධි පිරිනමන ලද |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | |
| විද්‍යාපති (M.Sc) | 01* | - | කිසිදු විදේශීය ශිෂ්‍යයෙක් සඳහා උපාධි පිරිනමා නොමැත |
| ව්‍යාපාර අධ්‍යයන විද්‍යාපති (M.B.A) | - | - | |
| දර්ශනපති (M.Phil) | - | - | |
| දර්ශන ශූරී (Ph.D) | 02** | 01 | |
| Casual | - | 02 | |
| එකතුව | **03** | **03** | |

* නයිජීරියානු ජාතික  ** තායිලන්ත ජාතික

මෙම වගුවෙන් 2013 වර්ෂයේදී අධ්‍යයන පාඨමාලා සඳහා ලියා පදිංචි වූ විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව දැක්වේ විමර්ශණයට භාජනය වී ඇති වර්ෂය තුළ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් 03 දෙනෙකු ලියා පදිංචි වී ඇති අතර එයින් MSc උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වී සිටි නයිජීරියානු ජාතික සිසුවා උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව 100 වැඩසටහන යටතේ සිය අධ්‍යාපන පාඨමාලාව හදාරයි

## 4. 2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ සිටි ස්ථිර කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| විෂයය | මාධ්‍යය | ජ්‍යෙ මහාචාර්ය | | මහාචාර්ය | | සහාය මහාචාර්ය | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | | කථිකාචාර්ය | | අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| අදාල නොවේ | ඉංග්‍රීසි මාධ්‍යය | 1 | | | | | | | 1* | | | 1 | | 2 | 1 |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| එකතුව | | 1 | | | | | | | 1 | | | 1 | | **2** | 1 |

* ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති යන තනතුරුද ඇතුළත්ව ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ ඉහත වගුවේ දක්වා ඇත . මීට අමතරව අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට අයත් තනතුරක් වන පරිගණක පද්ධති විශ්ලේෂක (Computer Programmer *cum* Systems Analyst) යන තනතුරද ඉහත වගුවට ඇතුළත් කොට ඇත . එසේම ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට යටත්ව අවශ්‍යතාව පරිදි එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු හා අධ්‍යයන සහායකයෙකු (Tutor) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

මෙම තනතුරු සඳහා ආයතනය විසින් උපයා ගනු ලබන ආදායමෙන් වැටුප් ගෙවනු ලැබේ. ආයතනයේ සියලුම අධ්‍යයන කටයුතු 300කට අධික බාහිර අධ්‍යයන කාර්යය මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රධාන වශයෙන්ම පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය කෘෂිකර්ම පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

## 5. 2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ සිටි ස්ථිර අනධ්‍යයන කාර්යය මණ්ඩලය

| අංශය | ජ්‍යෙෂ්ඨතම | | ජ්‍යෙෂ්ඨ | | කණිෂ්ඨ | | සුළු සේවක | |
|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| සාමාන්‍ය පරිපාලන | | 03 | - | - | 04 | - | 09 | **01** |
| සිසුන් බඳවා ගැනීම | - | 01 | - | 02 | 02 | 01 | 01 | - |
| ගිණුම් | 01 | - | - | 01 | 05 | - | 01 | - |
| පුස්තකාල | - | - | - | 02 | - | 01 | 04 | **01** |
| තොරතුරු තාක්ෂණ ඒකකය | | | | | 01 | - | 02 | |
| එකතුව | **01** | **04** | **-** | **05** | **12** | **02** | **17** | **02** |

අනධ්‍යයන කාර්යය මණ්ඩලය

වම්පසින් දී ඇති වගුවේ දන්වා වගුවේ දන්වා ඇත්තේ ආයතනය සතු අනධ්‍යයන කාර්යය මණ්ඩලයයි . සේවකයින් විශ්‍රාම ගැනීම හේතුකොටගෙන ඇති වූ ඇබෑර්තු පිරවීමේදී නියම කොට ඇති බඳවා ගැනීම් පටිපාටිය හේතුකොට ගෙන යම් බාධා ඇති වී තිබේ.

1 පරිපාලන හා විධායක මට්ටම  3. ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි
2 ජ්‍යෙෂ්ඨ මාන්ඩලික ශ්‍රේණි  4. පහළ ශ්‍රේණි

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ ආයතනයේ ලිපිකරු (111 වන ශ්‍රේණිය) යන තනතුරු සඳහා 04 දෙනෙකු බඳවා ගැනීමට හැකිව තිබේ. පිළිගැනීමේ නිලධාරිනී හා යතුරු ලේඛක (ඉංග්‍රිසි) යන තනතුරු සඳහා ආයතනයේ ඇබෑර්තු පැවතිය ද ඒ සම්බන්ධයෙන් පවතින ආයතනයට පාලනය කළ නොහැකි සාධක හේතුකොට එකී කාර්යය තවමත් ඉටු කර ගැනීමට නොහැකිව තිබේ.

### 5.1 බඳවා ගැනීම්

ආයතනයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ ඇබෑර්තු පිරවීමට පියවර ගෙන ඇති අතර ඒ සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.
2013.09.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි පී.පී. එල්. එස් රත්නසිරි මහතා ලිපිකරු (111 ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවාගෙන තිබේ.

පහත නම් සඳහන් අයවලුන් කම්කරු (111 ශේණියේ) තනතුරු සඳහා බඳවා ගෙන තිබේ

1. සංජීව සෙනවිරත්න
2. එච් එම් යු කේ හේරත්
3. එච් එම් ඩී ජයබංඩාර

## 5.2 ආයතනයේ කාර්ය මණ්ඩලය සහභාගී වූ පුහුණු වැඩසටහන් හා වැඩමුළු

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ ආයතනය සිය කාර්යය මණ්ඩලය පුහුණු කරවීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇත. සිය කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා අවශ්‍ය මට්ටමට ඉහළ නැංවීම සඳහා පවතින්නා වූ පුහුණු අවස්ථා උපයෝජනය කොට ඇත . අදාළ වර්ෂය තුළපරිපාලන අංශයට අයත් කාර්ය මණ්ඩලය හා ආයතනයේ අනෙකුත් සහය කාර්ය මණ්ඩලය විවිධ පුහුණුවීම් ලබාගෙන ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී එස් හේරත් මිය හා සහකාර ලේඛකාධිකාරී කාංචනා හේරත් මිය පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත .

- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය විසින් පවත්වන ලද ලංසු ඇගයීම (Bid Evaluation) පිළිබඳ පුහුණු වැඩසටහන
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරිවරුන්ගේ සංගමය විසින් පවත්වන ලද මහා පරිමාණ ප්‍රසම්පාදන (Large scale Procurement) සම්බන්ධ පුහුණු වැඩසටහන
- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩල පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පහත දැක්වෙන පුහුණු වැඩසටහන්
    1. ඉදිරිපත් කිරීමේ නිපුණතා
    2. අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම් පැවැත්වීම
    3. රජයේ වගවීම් ක්‍රියාවලිය හා දෙපාර්තමේන්තු තොග වට්ටෝරු පොත් කළමනාකරණය

මීට අමතරව සහකාර ලේඛකාධිකාරී එස් හේරත් මිය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ලෝක බැංකු ව්‍යාපෘතිය ඒකාබද්ධව පවත්වන ලද මානව සම්පත් සංවර්ධන හා නායකත්ව පුහුණු වැඩසටහන සඳහා සහභාගී වී ඇත . තවද ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද වැඩමුළු සඳහා ද සහභාගී වූවාය. මෙම වැඩමුළු කැළණිය විශ්ව විද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය (Center of Gender Studies), පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල සංගමය හා CARE ජාත්‍යන්තර සංවිධානය යන ආයතන ඒකාබද්ධව පවත්වන ලදී.

ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සමන් ජයකොඩි මහතා පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගි විය.

- නව බදු ප්‍රතිසංස්කරණ පිළිබඳ පුහුණු වැඩසටහන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ පුහුණු වැඩසටහන
- රජයේ වගවීම් ක්‍රියාවලිය හා දෙපාර්තමේන්තු ඉන්වෙන්ට්‍රි කළමනාකරණය

මෙයට අමතරව විමර්ශනයට භාජනය වී ඇති වසර තුළ නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී යන දෙදෙනාම උසස් අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද සංයුක්ත සැලසුම් සකස් කිරීම පිළිබඳ වැඩ මුළු කීපයකටම සහභාගී වූහ.

යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය විසින් පවත්වන ලද එලදායී ලෙස රථ වාහන කළමනාකරණය පිළිබඳ වැඩමුළුවකට සහකාර ලේඛකාධිකාරී කාංචනා හේරත් මිය හා ආයතනික ලිපිකරු එච් පී කේ කරුණාරත්න මයා සහභාගි කරවන ලදී.

එසේම ආයතනයේ පරිගණක පද්ධති විශ්ලේෂකඑී පී හේමපිත් මහතා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ලෝක බැංකුවේ HETC ව්‍යාපෘතිය ඒකාබද්ධව පවත්වන ලද වෙබ් අඩවි සංවර්ධනය හා කළමනාකරණය පුහුණු වැඩසටහන සඳහා සහභාගි විය

2013 වර්ෂයේදී අධ්‍යක්ෂකතුමාගේ පෞද්ගලික ලේකම් සී දහනායක මහත්මියද පහත සඳහන් වැඩමුළු /පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූවාය

- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද එලදායී ඉදිරිපත් කිරීමේ නිපුනතා පිළිබඳ පුහුණු වැඩසටහන
- නායකත්ව පුහුණු වැඩසටහන

ජ්‍යෂ්ඨ සහකාර පුස්තකාලාධිපති අයි මුදන්නායක මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයේ පුස්තකාලය විසින් පවත්වන ලද " Building of a Sri Lankan Consortium for Journals" යන වැඩමුළුවට සහභාගි විය.
එසේම ජ්‍යෂ්ඨ කාර්යය මණ්ඩල සහකාර එස් අමුණුගම මහත්මිය, පුස්තකාල සහයක එන් තෙන්නකෝන් මහත්මිය, ගබඩා භාරකරු චන්දිම පෙරේරා මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2013 දෙසැම්බර් 4 වන දින රජයේ වගවීම් ක්‍රියාවලිය හා දෙපාර්තමේන්තු ඉන්වෙන්ට්‍රි කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුවකට සහභාගි වූහ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද අභ්‍යන්තර විගණන කරුණු පිළිබඳ වැඩමුළුවකට ගිණුම් අංශයේ සේවයේ නියුතු හේමන්ති සමරසිංහ මහත්මිය හා අනුරුද්ධ හේරත් මහතා සහභාගි වූහ.

එසේම ආයතනයේ ජ්‍යෂ්ඨ කම්කරුවකු වන ආර් ඩී වීරසිංහ මහතා සහ රියදුරු සේවයේ නියුතු ජගත් තීක්ෂණ යන දෙපළ තරුණ කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය විසින් පවත්වන ලද "කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන් සඳහා නිපුනතා" යන වැඩමුළුවට සහභාගි වූහ.

## 6. 2013 වර්ෂයේදී කරන ලද පර්යේෂණ නව සොයා ගැනීම් සහ ප්‍රකාශන


| විෂය | ප්‍රකාශ කරන ලද | අලෙවි කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| පර්යේෂණ කෘති | - | - | 26 |
| නව සොයා ගැනීම් | | | |
| සඟරා | 04 | 04 | 04 |
| පොත් | | | |
| ලිපි | 55 | | 55 |
| වෙනත් | | | |
| එකතුව | 59 | 04 | 85 |

2013 වර්ෂයේදී ආයතනය සිදු කරන ලද පර්යේෂණ නව සොයා ගැනීම් පල කිරීම් වැඩසටහන් සම්මන්ත්‍රණ සම්මේලන සහ වැඩමුළු සම්බන්ධ තොරතුරු ඉහත වගුවේ දැක්වේ. ඉහත වගුවේ දක්වා ඇති සඟරා හා ලිපි විසිපස් වෙනි සංවත්සරය ඉතා උත්කර්ෂවත් අන්දමින් සමරමින් පැවැත් වූ වාර්ෂික සම්මේලනයේදී පලකළ ඒවා වන අතර පහත දක්වා ඇති ලිපි 55 න් 10ක්ම පෝස්ටර් වේවිමර්ශනයට භාජනය වී ඇති වර්ෂය  තුළ අධ්‍යයන මණ්ඩල 11ක් විසින් පශ්චාත් උපාධි පාඨමාලා 23ක් පවත්වන ලදී. එකී වර්ෂය තුළ ඉදිරිපත් කිරීම් 26ක් කරන ලද අතර ඉන් 05ක්ම සිසුන් විසින් සිය දර්ශන ශූරී (Ph.D) සහ දර්ශනපති(M.Phil) උපාධි පාඨමාලා සඳහා සම්පාදනය කරන ලදී විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළCAPNET International යන ව්‍යාපෘතිය හා එක්ව කෘෂි ඉංජිනේරු දෙපාර්තමේන්තුව සම්මන්ත්‍රණ 31 ක් පවත්වා ඇත. මෙයට එකී වර්ෂය තුළ සිය පශ්චාත් උපාධි පාඨමාලාවේ ඉහලම GPA අගය ලබාගත් ශ්‍රී ක්‍රිෂ්ණා මහතාට වාර්ෂික සම්මේලනයේදී කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය විසින් ජොකිම් අනුස්මරණ ත්‍යාගය (Joachim Memorial Award) පිරනමන ලදී.

## 7 a). 2013 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන් සම්මන්ත්‍රණ සම්මේලන සහ වැඩමුළු පිළිබඳ විස්තර

| වැඩසටහන | ඇතුළත් වු සංඛ්‍යාව | සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව |
|---|---|---|---|
| පශ්චාත් උපාධි | - | - | 23 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| උපාධි වැඩසටහන් | 23 | - | - |
| ඩිප්ලෝමා වැඩසටහන් | - | - | - |
| සහතික පාඨමාලා | | | |
| පර්යේෂණ සංෂිප්ත | | | 55 |
| පොත් පරිච්ඡේද | | | |
| ඉදිරිපත් කිරීම් | | | 26 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | |
| උපාධි වැඩසටහන් | 21 | | |
| ඩිප්ලෝමා වැඩසටහන් | | | 08 |
| සම්මන්ත්‍රන | | | 31 |
| | 44 | | 143 |

## 7 b). කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය - වාර්ෂික මහා සම්මේලනය (2013)




ඡායාරූපය - 2013 වර්ෂයේදී පවත්වන ලද වාර්ෂික සම්මේලනයේ සමාරම්භක උළෙල

ආයතනික දින දර්ශනයේ ඉතා සුවිශේෂී අංගයක් වන වාර්ෂික පර්යේෂණ සම්මේලනය 2013 වර්ෂයේදී සිය රිදී ජුබිලිය සැමරූ බැවින් එම වර්ෂය කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයට ඉතා සුවිශේෂී වර්ෂයක් විය.

මෙම වාර්ෂික සම්මේලනය දේශීය හා විදේශීය පර්යේෂකයන් හට හා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට හා සිසුන්හට ඔවුන් විසින් කරන ලද පර්යේෂණ වලින් ලබා ගත් දැනුම පිළිබඳ සාකච්ඡා කිරීමට එකී දැනුම බෙදාහදා ගැනීමට හා එම දැනුම ප්‍රචලිත කිරීම සඳහා කදිම වේදිකාවකි.

ලෝක ආහාර හා කෘෂිර්ම සංවිධානයේ (FAO) ශ්‍රී ලංකාවේ හා මාල දිවයිනේ නිත්‍ය නියෝජිත බෙත් එස් ක්‍රෝෆෝර්ඩ් (Beth S. Crawford) මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2013 නොවැම්බර් 20-22 යන දිනයන්හි මහනුවරදී මෙම සම්මේලනය ඉතා උත්කර්ෂවත් අයුරින් සිදු කරන ලදී.

මෙම වාර්ෂික සම්මේලනයේදී ආයතනයේ පර්යේෂකයින් හා ඔස්ට්‍රේලියාව කැනඩාව ඉන්දියාව යන රටවලින් පැමිණි පර්යේෂකයින් කීපදෙනෙකු විසින් පර්යේෂණ කෘති 55ක් ඉදිරිපත් කළ අතර, එයින් 10ක් පෝස්ටර් ඉදිරිපත් කිරීම් (Poster Presentation) විය. මෙම අවස්ථාවේදී ආයතනයේ උන්නතිය උදෙසා හා එකී වාර්ෂික සම්මේලන ඉතා සාර්ථකව පැවැත්වීම සඳහා ඉතා වටිනා දායකත්වයක් සැපයූ ආයතනයේ සේවය කොට විශ්‍රාම ලැබූ සියලුම අධ්‍යක්ෂවරුන්ට හා මෙම වාර්ෂික සම්මේලනවල හිටපු සම්බන්ධීකාරකවරුන්ට සුභාසිංසන පිරිනමන ලදී.

විසිපස්වන වාර්ෂික සම්මේනයේදී පහත සඳහන් සිසුන් 12 දෙනා හොඳම ඉදිරිපත් කරන්නන් ලෙස තෝරා ගන්නා ලදී

ඩී.සේනාරත්න - සත්ව විද්‍යාව හා වනජීවීන්


යූ.එම් අරුණ කුමාර -පැළෑටි ව්‍යාධිකාරක හා එහි අන්තර් ක්‍රියාකාරිත්වය

එම්.කේ.එන් .කුමාරි - කෘෂිකර්මය සඳහා අවශ්‍ය ජලයේ ගුණාත්මකභාවය


ඒ.ආර් ගුණවර්ධන – ජිව විද්‍යාත්මක ආක්‍රමණ

එම්.ඒ .පී.ඩබ්.කේ මලවී ආරච්චි -දේශගුණය හා බෝග කළමනාකරණය

ඩී.බෝපිටිය - ආහාර පෝෂණය සහ පසු අස්වනු තාක්ෂණය



වාර්ෂික සම්මේලනයේ හොඳම ඉදිරිපත් කිරීමක් වෙනුවෙන් කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂතුමාගෙන් සිය තිළිණය ලබා ගත් සිසුවියක්



වාර්ෂික සම්මේලනයේ හොඳම ඉදිරිපත් කිරීමක් වෙනුවෙන් කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂතුමාගෙන් සිය තිළිණය ලබා ගත් ශිෂ්‍යයෙක්

ඩී.පී මානවඩු - අනුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය

එම්.එම් .ඩී .ඒ .කේ හේරත් – fnda. ksIamdokh

කේ.හේරත්–කෘෂිකර්මාන්තය සඳහාසංඛ්‍යාත්මක ක්‍රම

සී.ඒ.කේ දිසානායක - ආර්ථික විද්‍යාව හා ව්‍යාප්ති

යූ.කේ .පී .එස් සංජීවනී - පාංශු සම්පත් කළමනාකරණය

ටී.ඒ.බී.ඩී . සංජීව - පෝස්ටර් ඉදිරිපත් කිරීම්

## 8.a) 2013 වර්ෂයේදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු/දැනුවත්කිරීමේ වැඩසටහන් සහ කෙටිකාලීන පාඨමාලා පිළිබඳ විස්තර

"කණ්ඩායම් වැඩ හා නායකත්වය " පිළිබඳ පුහුණු වැඩසටහන



"පරීක්ෂණ සැලසුම් කිරීම හා විශ්ලේෂණය" පිළිබඳ වැඩමුළුව



| අංකය | කරන ලද වැඩසටහන | ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|---|
| **01.** | පරීක්ෂණ සැලසුම් කිරීම හා විශ්ලේෂණය | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය/ජීව සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 08 | **01/05/13** |
| **02.** | ජල වෘත්තිකයන්ගේ දිනය | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | 150 | **01/10/13** |
| **03.** | කණ්ඩායම් වැඩ හා නායකත්ව පුහුණු වැඩසටහන | කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | 45 | **22-24/11/13** |
| **04** | නියදීම් ක්‍රම පරීක්ෂණ සැලසුම් කිරීම හා විශ්ලේෂණය | ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | 130 | **04-06/09/13** |
| **05** | මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ජල යෝජනා ක්‍රම සඳහා නියඟයෙන් ඇතිවන අවධානම කළමනාකරණය කිරීම | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | 45 | **16/05/13** |
| **06** | Gender water dialogues in Kilinochchi district in Nothern Province, Sri Lanka | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | 42 | **24-25/06/13** |
| **07** | ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශවල ජල පෝෂක ප්‍රදේශ වැඩි දියුණු කිරීම සඳහා ඒකාබද්ධ ඉඩම් හා ජල සම්පත් කළමනාකරණය | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | **35 + 40** | **14-15/03/13**<br>**29-30/07/13** |

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ අධ්‍යයන මණ්ඩල බොහෝමයක් විවිධ පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රණ හා කෙටිකාලීන පාඨමාලා පැවැත්වූ අතර එමගින් ආයතනය සඳහා ආදායමක් උපයා ගැනීමට හැකි විය.මෙය පෙර වසරවල් හා සසඳන කළ සුවිශේෂී දියුණුවක් ලෙස දැක්විය හැකිය.මක්නිසාද යත් මින් පෙර බොහෝ අධ්‍යයන මණ්ඩල මෙවැනි ක්‍රියාකාරකම් සිදුකොට නොතිබුණි. මේ සඳහා කෘෂි ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව සිය ජාත්‍යන්තර සහයෝගිතා ව්‍යාපෘතියක් වන Cap Net Lanka ව්‍යාපෘතිය හරහා විශාලතම දායකත්වය සපයා ඇත.

## 8.b) 2013 වර්ෂයේදී කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන සත්කාරකත්වය දරන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා වැඩමුළු

| අංකය | පවත්වන ලද වැඩසටහන | ආයතනය | සහභාගී වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|---|
| **01.** | නේපාල ජාතිකයන් සඳහා පවත්වන ලද බීජ නිෂ්පාදන හා අලෙවිකරණය පිළිබඳ වැඩමුළුව | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | **11** | **5-10/05/13** |
| **02.** | ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව හා ගොඩ නැගීම් කළමනාකරණය /නාගරික ජලාශ්‍රිත පරිසර පද්ධතිවල මෙහෙයුම් කටයුතු හා කළමනාකරණය පිළිබඳ සිව්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | **07** | **15/12/201** |





කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය ජාත්‍යන්තර සම්මේලන දෙකක් පවත්වා ඇත. එම සම්මේලන වලින් වගුවේ දක්වා ඇති දෙවන සම්මේලනය CAPNET Lanka ව්‍යාපෘතියේ සහයෝගිත්වය ඇතිව පවත්වන ලද අතර පළමුවන සම්මේලනය කෘෂිකර්ම පීඨ සාමාජිකයන්ගේ සහය ඇතිව පවත්වන ලදී.

## 9. 2013 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් විසින් ලබා ගන්නා ලද සම්මාන

| විෂයය | ලබා ගත් සම්මාන | අධ්‍යයන කාර්යය මණ්ඩලය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශිය සම්මාන | 12 | | 12 |
| ජාතික සම්මාන | - | - | - |
| අන්තර් ජාතික සම්මාන | - | | - |
| වෙනත් | - | - | |
| එකතුව | 12 | | 12 |

කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය විසින් ලබා ගන්නා ලද සම්මාන පිළිබඳ මෙම වගුවෙන් පෙන්නුම් කෙරේ. 2013 වාර්ෂික සම්මේලනයේදී තෝරාගත් පරිදි සිසුන් 12 දෙනෙක් සඳහා හොඳම ඉදිරිපත්කරන්නාට දෙනු ලබන සම්මානය ප්‍රදානය කරන ලදි.මෙම සියලුම සම්මාන දේශියව ප්‍රදානය කරන ලදි.මෙම වර්ෂය තුළ කථිකාචාර්ය මණ්ඩලයේ කෙනෙකු සම්මාන ලබාගෙන නොමැත.

## 10. 2013 වසරේදී ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

ආයතනය අදාළ වර්ෂය තුළ පශ්චාත් උපාධිපාඨමාලා 03ක් හඳුන්වා දීමට ප්‍රයත්න දරා තිබේ.එයින් බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් සැලසුම් කරන ලද උද්‍යාන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි(M.Sc) සහ වැවිලි බෝග කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි(M.Sc) පාඨමාලා දෙක සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස මේ වන විටත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යවා ඇත . නමුත් මෙම අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් එකී පාඨමාලා අදාළ වර්ෂය තුළ ආරම්භ කිරීමට නොහැකි වී ඇත . මීට අමතරව කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව විසින් යෝජනා කොට ඇති විද්‍යාපති (M.Sc) උපාධි පාඨමාලාව සඳහා විශ්ව විද්‍යාල පාලනාධිකාරියේ අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කොට ඇත .

## 11. සාමාන්‍ය පරිපාලනය

### 11.1 පැරණි ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම

1981 වසරේදී ඉදිකරන ලද පැරණි ගොඩනැගිල්ල සඳහා නව පෙනුමක් ලබා දෙමින් අලුත් වැඩියා කටයුතු කිරීම අදාළ වර්ෂය තුළ සිදු කරන ලදි. මේ හේතුකොටගෙන ආයතනය සතුව තිබූ පන්තිකාමර 13ක සංඛ්‍යාව 17 ක් දක්වා ඉහළ නැංවීමට හැකි වූ අතර, එම පන්තිකාමර සඳහා නවීනතම පහසුකම් සපයා ඇත .

කථිකාචාර්ය මණ්ඩලයට හා සිසුන්ට සිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අන්තර්ජාලය හරහා පහසුවෙන් කරගෙන යාමේ පරිසරයක් නිර්මාණය කිරීම පිණිස කළමනාකරන තොරතුරු පද්ධතියක් (Management Information System) ස්ථාපනය කරන ලදි. එසේම පාලනාධිකාරියට ද සිය පරිපාලන කටයුතු කාර්යක්ෂම හා සඵලදායී ලෙස කරගෙන යාමට මෙම කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් පහසුකම් සැළසී ඇත .මීට අමතරව විගණන විමසුම් හා කළමනාකරණයේදී පැන නගින ගැටළු මගහරවා අවම කර ගැනීම පිණිස සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලිය මනා සංවිධානාත්මක ව්‍යුහයක් තුළ සිදු කෙරේ. මෙම කාර්යය සාක්ෂාත්කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (Development of Public Enterprise Circular) නියම කොට ඇති පරිදි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කරන ලදි.විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළදී මෙම කමිටුව දෙවරක් රැස් වී ඇත . ආයතනයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මතුවී තිබෙන ගැටලු මෙම කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද අතර, එහිදී ගන්නා ලද තීරණ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ විගණන කමිටුව හතර වතාවක් රැස් වී ඇත . ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු සම්පූර්ණ කොට ඇති අතර අවශ්‍ය ප්‍රතිසන්ධාන කටයුතු කරගෙන යමින් පවතී. මෙයට අමතරව 2013 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළසුම් සකස් කිරීමේ කටයුතු ද ආරම්භ කොට ඇත වර්ෂ 2012 සඳහා වූ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා ඇති ගැටලු සඳහා පිළිතුරු ලබා දීමට හැකි සෑම පියවරක්ම ගෙන තිබේ. 2013 වර්ෂය සඳහා නියම කොට ඇති පරිදි කළමනාකරණ මණ්ඩලයේ හා විගණන කමිටුවේ රැස්වීම් අඛණ්ඩව පවත්වනු ලැබ ඇත .

කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව පරිපාලන ක්‍රියාවලිය වඩා සංවිධානාත්මකව කරගෙන යාම පිණිස නීති හා රෙගුලාසි සම්පාදනය කිරීමේ කටයුතු සඳහා මහාචාර්යවරයෙකුගේ උපදේශන සේවා ලබා ගන්නා ලදී ඔහු 2014-2018 කාලය සඳහා වන සංයුක්ත සැලසුම සකස් කිරීමටද දායක වී ඇති අතර 2013 නොවැම්බර් 29 වන දින වැඩමුළුවක් පවත්වමින් එකී කාර්යය අවසන් කරන ලදි.මීට අමතරව අදාළ මහාචාර්යවරයා පහත සඳහන් ලිපි ලේඛන සකස් කිරීමටද දායක වී ඇත.

1. කාර්ය පටිපාටි පිළිබඳ අත්පොත
2. සංයුක්ත සැලැස්ම 2014-2018
3. කථිකාචාර්ය මණ්ඩලය සිසුන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා වූ අත්පොත

## 11.2. ආයතනයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය

ලෝක බැංකුවේ සහය ඇතිව ඉහත කී කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කරන ලද අතර අදාළ වර්ෂයේ අවසාන භාගයේදී මෙහි ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

ආරම්භයේදී මෙම කලමනාකරණ තොරතුරු පද්ධතිය හරහා ශිෂ්‍ය ලියාපදිංචිය හා පරිපාලනයට අදාළ සියලු කටයුතු සිදු කරන ලදී. මෙම පද්ධතිය මගින් ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ කටයුතු ,ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීමේ කටයුතු අන්තර්ජාලය හරහා කථිකාචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් අතර සන්නිවේදන කටයුතු විභාග පැවැත්වෙන අවස්ථා හා දේශන ශාලා නිරීක්ෂණය කිරීමේ කටයුතු ඉතා පහසුවෙන් කරගෙන යාමට හා ඒවා පහසුවෙන් අධීක්ෂණය කිරීමට හැකියාව ලැබී තිබේ. ආයතනයේ කාර්ය මණ්ඩලය හා සිසුන් මුහුණ දෙන ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබාදීමට මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉවහල් වී ඇත .

## 11.3. සුබසාධන හා විනෝද කටයුතු


කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිසුන්ගේ අධ්‍යයන කටයුතු හා පෞද්ගලික ජීවිතය අතර සමබරතාවයක් පවත්වා ගැනීමට ඉවහල් වන වඩා යහපත් කායික හා මානසික සෞඛ්‍යයක් පවත්වා ගැනීමේ වැදගත්කම මනාව හඳුනා ගෙන ඇත .ඒ මක් නිසාද යත් නිදහස් මනස නිරතුරුවම සේවක කාර්යක්ෂමතාව හා නව සොයා ගැනීම් පිලිබඳ අදහස් මතු වීමට හේතු සාදක වන බැවිනි. ඒබැවින් ආයතනය සිය කාර්යය මණ්ඩලයට/සිසුන්ට හා ඔවුන්ගේ පවුල්වල ලඟම ඥාතින්ට විනෝද ගමන් හා ක්‍රීඩා කටයුතු කිරීමට අවශ්‍ය අවස්ථා සලසා දෙයි. අදාළ වර්ෂය තුළදී ආයතනයේ කාර්යය මණ්ඩලයට වර්ෂය පුරා විනෝද කටයුතු හා ක්‍රීඩා කටයුතු සඳහා මං පෙත් හෙළි කරමින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රීඩා හා විනෝද කටයුතු සංගමය  ආරම්භ කරන ලදී. මෙම සංගමය ආරම්භ කිරීමෙන් පසුව අදාළ වර්ෂයේ අවසාන බාගයේදී අධ්‍යක්ෂ අභියෝගතා තරඟාවලිය නමින් සය සාමාජික ක්‍රිකට් තරඟාවලියක් සංවිධානය කරන ලද අතර, එම තරඟාවලිය 2014 ජනවාරි මුල් භාගයේදී අවසන් කරන ලදී මෙම තරඟාවලිය සඳහා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතයේ සිසුන් වෙනත් පීඨවල සිසුන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ හා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය මණ්ඩලය එසේම අධ්‍යයන හා අනධ්‍යයන සහය සේවකයින්ගෙන් සැදුම්ලත් ක්‍රිකට්කණ්ඩායම් සහභාගි වූහ. මෙම තරඟාවලිය පේරාදෙණීය විශ්ව විද්‍යාලයීය ක්‍රිකට් ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි.

තරඟාවලියේ අනුශූරයින් බවට පත් වූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය කණ්ඩායම




තරඟාවලියේ ශූරතාවය හිමිකරගත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය කණ්ඩායම





පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම
වමේ සිට දකුණට පළමුවැන්නා ඒ පී ආර් බී ජයතිලක.
වමේ සිට දකුණට හත්වැන්නා PGIA නියෝජනය
කරමින් වරුණ විජේනායක.

PGIA කාර්ය මණ්ඩලයේ ඒ පී ආර් බී ජයතිලක සහ වරුණ විජේනායක යන අය විශ්ව විද්‍යාල ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයන් විය. මෙම කණ්ඩායම රාජ්‍ය සේවා Division B, පිලිමලුන් පිටු දැකීමේ ක්‍රමයට පවත්වන ලද ක්‍රිකට් තරඟාවලියේ අර්ධ අවසාන තරඟයට තේරී පත් විය. ඒ පී ආර් බී ජයතිලක මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරමින් සමස්ත ලංකා රාජ්‍ය සේවා ක්‍රිකට් තරඟාවලියට සහභාගි විය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් මෙම කණ්ඩායම් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදී.

## 11.4 ආයතනයේ වාර්ෂික චාරිකාව

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික චාරිකාව 2014 පෙබරවාරි මාසයේදී සංවිධානය කරන ලද අතර මෙහිදී මහමෙවුනා උයන විහාරස්ථානය හා කිතුල්ගල නරඹන ලදී. කිතුල්ගල ගඟේ ඔරු පැදීම චාරිකාව සහභාගි වූවන්ට ඉමහත් මානසික තෘප්තියක් ගෙන දීමට සමත් විය. මෙයට අමතරව ආයතනයේ කාර්යය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් 2014 වර්ෂයේ අවසාන භාගයේදී දින දෙකක චාරිකාවක් සංවිධානය කරන ලදී. මේ සඳහා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය හා එම ආයතනික කාර්ය මණ්ඩලයේ මුල්‍ය දායකත්වයෙන් සිදු කරන ලදී. මෙම චාරිකාව විල්පත්තු අභය භූමිය නැරඹීම සඳහා සංවිධානය කරන ලද අතර ඒ යන අතරමගදී සිය දරුවන්ට වටිනා අත්දැකීම් හා දැනුම ලබා ගැනීමට මහගු පිටිවහලක් වූ හෝල්සිම් සිමෙන්ති කර්මාන්ත ශාලාව පුත්තලම ශ්‍රී ලංකා ලුණු සංස්ථාව නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය යන ආයතනද නරඹන ලදී.



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්යය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් මහමෙවුනා උයන විහාරස්ථානයේදී



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කර්යය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් නොරොච්චෝලේ විදුලිබලාගාර භූමියේ  ඡායාරූපයකට පෙනී සිටිමින්

## 12. කෘෂිකර්ම පීඨ පුස්තකාලය - වාර්ෂික වාර්තාව (2013)

වගු අංක 01 - 2013 වසරේදී පුස්තකාලය සඳහා ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන

| | |
|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන | රු 1000,000.00 |
| කෘෂිකර්ම පීඨයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන | 928,940.00 |
| එකතුව | 1,928,940.00 |

### පුස්තකාලයේ පොත් සංචිතයට එකතු වූ පොත්

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හා කෘෂිකර්ම පීඨයේ පවත්වනු ලබන උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන්වලට ගැලපෙන පරිදි එම ආයතන දෙකෙහි කථිකාචාර්ය මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද පොත් 94 ක් ද ඇතුළත්ව පොත් 410 ක් 2013 වසර තුළදී පුස්තකාල පොත් සංචියට එකතු වී තිබේ. මෙම පොත් 410 න් පොත් 63ක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමයේ කැනඩාවේ ඔටාවා පාර්ශවය විසින් ප්‍රදානයක් ලෙස දෙන ලදී .

වගු අංක 02 - පොත් සංචිතයට අලුතින් එකතු වූ පොත් පිළිබඳ විස්තර

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල්වලින් මිලදී ගන්නා ලද පොත් | 08 | 13831.96 |
| කෘෂිකර්ම පීඨයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මිලදී ගන්නා ලද පොත් | 88** | 1,253,360.10** |
| කෘෂිකර්ම පීඨය හා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය යන ආයතන දෙකෙන්ම මිලදී ගත් පොත් සංඛ්‍යාව | 94 | |
| කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් පොත් සංචිතයට ලබා දෙන ලද පශ්චාත් උපාධි නිබන්ධන | 36 | |

* එක් සංයුක්ත තැටියක්ද ඇතුළත්ව

** කෘෂිකර්ම පීඨයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා ඇත

වගු අංක 03 - පරිත්‍යාගයන්

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ආදි විද්‍යාර්ථයින්ගේ සංගමයේ කැනඩාවේ ඔටාවා පාර්ශවය විසින් ප්‍රදානය කරන ලද පොත් | 63 | 355,661.72 |
| වෙනත් දානපතීන්ගෙන් ලැබුණු පොත් | 217 | 792,709.87 |
| පුස්තකාල පොත් සංචිතයට අළුතින් එකතු වූ මුළු සංඛ්‍යාව(මිලදී ගැනීම් හා පරිත්‍යාග) | 410 | |

### වාර සඟරා

විදේශිය වාර සඟරා 10ක් ද ඇතුළුව වාර සඟරා 15ක් 2013 වසර තුළ දී පුස්තකාල සංචිතයට එකතු කරන ලදී. මෙම වාර සඟරා මිලදී ගැනීම සඳහා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම උපයෝජනය කරන ලදී.

වගු අංක 04 - පුස්තකාලය සඳහා පොත් මිලදී ගත් ආකාරය

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි අරමුදල් වලින් ඇණවුම් කොට ඇති වාර සඟරා | 14 | 982,576.56 |
| කෘෂිකර්ම පීඨයේ ප්‍රතිපාදන වලින් ඇණවුම් කොට ඇති වාර සඟරා | 01 | 2000.00 |
| කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය හා කෘෂිකර්ම පීඨය විසින් ඇණවුම් කොට ඇති වාර සඟරා සංඛ්‍යාව | 15 | 984,576.56 |

වගු අංක 05 - 2013 වසරේදී ලියා පදිංචි වී සිටි පුස්තකාල භාවිත කරන්නන්

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| පශ්චාත් උපාධි ශිෂ්‍යයන් | 1225 |
| උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් | 912 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය (ස්ථිර) | 226 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය (තාවකාලික) | 18 |
| ලිපිකරු හා සමාන්තර සේවා | 06 |
| පුස්තකාලය කෙටිකාලීනව භාවිත කරන්නන් | 31 |
| **එකතුව** | **2387** |

2013 වර්ෂය තුළදී කථිකාචාර්ය මණ්ඩලය හා සිසුන් අතර හුවමාරු වූ මුළු පොත් සංඛ්‍යාව 5372 කි.

### පුස්තකාල අතර ණය පනදම මත පොත් පත් හුවමාරු කර ගැනීම

සිසුන් විසින් වෙනත් පුස්තකාල වලින් ණය පදනම මත ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන ලද පොත් පත් සංඛ්‍යාව 14 කි. වෙනත් පුස්තකාල විසින් ලිපි ලේඛන 23ක් සඳහා ඉල්ලීම් ලැබුණු අතර කෘෂිකර්ම පීඨ පුස්තකාලය ඒ සඳහා පොත් 20ක් සපයා ඇත .

**AGRINET - කෘෂිකර්ම තොරතුරු ජාල සේවය**

AGRINET journal content page service වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට සම්බන්ධ විද්‍යාඥයින්ගේ හා පර්යේෂකයන්ගේ ( Scientists of National Agricultural Research System) ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවේ කෘෂි විද්‍යා පුස්තකාල අතර සඟරාවල පටුන සඳහන් පිටු (Content pages of Journals) බෙදා හරින ලදී. මෙම වැඩසටහන යටතේ කෘෂිකර්ම පීඨයට අයත් පුස්තකාලය මගින් සඟරා 70 ක පටුන අඩංගු පිටු විද්‍යාඥයින්ගේ ප්‍රයෝජනය සඳහා බෙදා හැර ඇත .

**පොත්පත් සෙවීමේ කටයුතු**

කෘෂිකර්ම පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ කටයුතුවල නියැලී සිටින සිසුන් විසින් පොත්පත් පිළිබඳ සොයා බැලීමේ කටයුතු සඳහා CAB CD – ROM පරිගණක දත්ත ගබඩාව භාවිත කරන ලදී. 2013 වර්ෂය තුළදීCAB පිරික්සීම් 52 ක් සිදු කරන ලදී.

**Tropical Agricultural Research නමැති පර්යේෂණ ලිපි ඇතුළත් ග්‍රන්ථය අලෙවි කිරීම හා වෙනත් ආයතන සමග හුවමාරු කර ගැනීම**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| 2012 වර්ෂයේ දී අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව (සම්පූර්ණ වෙළුම) | 12 |
| 2012 වර්ෂයේ දී අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව (තනි මුද්‍රණය) | 15 |
| වෙනත් ආයතන විසින් මුද්‍රණය කරනු ලබන ප්‍රකාශනයන් සඳහා යොදා ගැනීමට දෙන ලද පිටපත් සංඛ්‍යාව | 10 |

**ජාතික විද්‍යා පදනම විසින් ක්‍රියාත්මක කරන ලද ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය**

ආයතනය සතු ප්‍රකාශන හා පශ්චාත් උපාධි නිබන්ධන සංචිතය තව දුරටත් වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ජාතික විද්‍යා පදනම විසින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරුවෙකු සහ සන්ජේ පුද්ගලික සමාගම විසින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතු පශ්චාත් උපාධි නිබන්ධන සංචිතය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලදී.

### දරණ ලද තනතුරු

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති අයි. මුදන්නායක මහත්මිය කෘෂිකාර්මික පර්යේෂණ පිළිබඳ ප්‍රතිපත්ති සභාව (Council of Agriculture Research Policy - CARP) උපදේශක කමිටුවේ සභාපති ධුරය උසුලන ලදී.

### ප්‍රකාශන

ඩබ්. පී. ටී. බී දිල්රුක්ෂි සහ අයි මුදන්නායක යන දෙපළ විසින් 2013 පෙබරවාරි මස 03 වන දින මිහින්තලය රජරට විශ්ව විද්‍යාලය විසින් පවත්වන ලද තුන්වන වාර්ෂික පර්යේෂණ සම්මේලනයේ ඉදිරිපත් කරන ලද පර්යේෂණ කෘතියක් වන Information Ditermination through Extension System නම් පර්යේෂණ කෘතිය ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති තනතුර දරණ අයි මුදන්නායක මහත්මිය "Journal of the University Librarians Association Sri Lanka" නමැති ග්‍රන්ථයේ 17 වන වෙළුමේ පිටු අංක 1 සහ 2 යන පිටු පිළිබඳ විචාරකයෙකු ලෙස කටයුතු කළාය. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති අයි. මුදන්නායක මහත්මිය කැළණි විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි නිබන්ධන දෙකක අධීක්ෂක ලෙස කටයුතු කර ඇත.එම නිබන්ධන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.


1. Community Information Services in Public Libraries in the Central Province Sri Lanka
2. Agriculture Information Dissemination to farmers

# 13. 2013 වසරේදී ආයතනයේ මුල්‍යමය කාර්යය සාධනය

## 13.1 පුනරාවර්තන වියදම පිළිබඳ විස්තර

| විෂයය | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|
| | වෙන්කරන ලද ප්‍රතිපාදන (රුපියල්) | ලැබුණු ප්‍රතිපාදන (රුපියල්) | වෙන්කරන ලද ප්‍රතිපාදන (රුපියල් ) | ලැබුණු ප්‍රතිපාදන (රුපියල්) | වෙන්කරන ලද ප්‍රතිපාදන (රුපියල් ) | ලැබුණු ප්‍රතිපාදන (රුපියල්) |
| a) පුද්ගල පඩිනඩි | **40,718,000** | 32,281,916 | **44,764,000** | 39,408,203 | **41,203,000** | 39,907,916 |
| b) ගමන් වියදම් | **350,000** | 86,548 | **255,000** | 69,593 | **100,000** | 90,183 |
| c) සැපයුම් | **3,365,000** | 2,530,910 | **3,173,000** | 2,992,028 | **3,625,000** | 3,303,068 |
| d) නඩත්තු කටයුතු | **950,000** | 713,751 | **1,451,000** | 737,389 | **985,000** | 1,239,819 |
| e) ගිවිසුම්ගත සේවා | **6,055,000** | 4,840,840 | **6,076,000** | 5,158,518 | **5,635,000** | 5,448,947 |
| f) වෙනත් | **17,920,000** | 12,240,319 | **19,910,000** | 9,598,707 | **18,290,000** | 19,137,868 |
| එකතුව | **69,358,000** | 52,694,284 | **75,629,000** | 57,964,438 | **69,838,000** | 69,127,802 |
| | | | | | | |
| රජයෙන් සපයන ලද ප්‍රතිපාදන | **22,585,072** | | **15,400,000** | | **19,000,000** | |
| ප්‍රතිශතයක් ලෙස | **33%** | | **20%** | | **27%** | |
| ආයතනය විසින් උත්පාදනය කරන ලද අරමුදල් | **46,772,928** | | **60,229,000** | | **50,838,000** | |
| ප්‍රතිශතය | **67%** | | **80%** | | **73%** | |

2013 වසරේ පුනරාවර්තන වියදම්වල සංයුතිය





මහා භාණ්ඩාගාරය විසින් 2013 වසරේදී ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 19 ක් වෙන් කරන ලද අතර මුලධන වියදම් සඳහා රුපියල් මිලියන 9.2 වෙන් කරන ලදී.එය පසුගිය වසර හා සසඳන කළ පිළිවෙලින් රුපියල් මිලියන3.6 ක වැඩිවීමක් හා 0.6 ක අඩු වීමක් පෙන්නුම් කරයි. 2013 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රුපියල් මිලියන 69.08 ක් සහ 13.04 ක් ලැබුණි.

මුළු පුනරාවර්තන වියදමෙන් (73%) ආයතනය විසින් උත්පාදිත අරමුදලෙන් දරන ලද අතර ඉතිරි (27%) ඒකාබද්ධ අරමුදලෙන් දරන ලදී. පුනරාවර්තන වියදමෙන් 58% ක් පමණ ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන ගෙවීමට ද, බාහිර කථිකාචාර්යවරුන්ගේ දේශන දීමනා ගෙවීමට ද වැය කරන ලදී. විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ මුළු පුනරාවර්තන වියදමෙන් 27 % ක් පාඨමාලා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට ද විශේෂ සේවා හා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ට ගමන් වියදම් ගෙවීමට ද වාර්ෂික සම්මේලනයේ වියදම් සඳහා ද වැය කරන ලදී. පුනරාවර්තන වියදමේ සංයුතිය ඉහත රූප සටහනේ දී ඇත.

## 13.2 මූලධන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2011 | | 2012 | | 2013 ) | |
|---|---|---|---|---|---|---|
| | වෙන්කරන ලද ප්‍රතිපාදන රුපියල් | ලැබුණු ප්‍රතිපාදන රුපියල් | වෙන්කරන ලද ප්‍රතිපාදන රුපියල් | ලැබුණු ප්‍රතිපාදන රුපියල් | වෙන්කරන ලද ප්‍රතිපාදන රුපියල් | ලැබුණු ප්‍රතිපාදන රුපියල් |
| a) ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනිම | **4,000,000** | 70,826 | **2,000,000** | 2,988,881 | **2,500,000** | 3,976,203 |
| **b) විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ මිලදී ගැනීම** | - | - | - | 667,520 | - | - |
| **c) ගොඩනැගිලි හා ව්‍යුහයන් අලුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීම** | **6,000,000** | - | **7,800,000** | 267,937 | **6,706,000** | 8,430,449 |
| **d) රථ වාහන** | - | - | - | 8,350,000 | - | - |
| **e) වෙනත් පුස්තකාල පොත් පත් සහ වාර සඟරා** | **1,500,000** | 325,087 | **1,500,000** | 8,023 | - | 996,409 |
| **එකතුව** | **11,500,000** | **395,913** | **9,800,000** | **12,282,361** | **9,206,000** | **13,403,061** |




මූලධන ආයෝජන අයවැයෙන් 63% ක් එනම්, ආසන්න වශයෙන් රුපියල් මිලියන 8.43ක් අංක 01 ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය කළ අතර, එකී අයවැයෙන් 30% ක් එනම් ආසන්න වශයෙන් මිලියන 3.98 ක් පන්තිකාමරවල හා පරිගණක කාමරයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කරන ලදී. මෙයට අමතරව ආයතනයේ පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් සහ වාර සඟරා මිලදී ගැනීම සඳහා රුපියල් මිලියනයකට ආසන්න මුදලක් වැය කරන ලදී.අදාල වර්ෂය තුළ දරන ලද මූලධන වියදම්වල සංයුතිය ඉහත සඳහන් රූප සටහනේ නිරූපනය කොට ඇත.

**පේරාදෙණිය විශ්ව විද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කරන ලද ව්‍යවස්ථාපිත වාර්තා සහ ඉතා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

## 1. සාමාන්‍ය

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය 1979 අංක 09 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන ආඥා පණතේ 12(3) (ඉ) සහ 19(1) වගන්තියද, අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 12(3) (ඉ) සහ 19(1) වගන්තියද, අංක 16 දරන විශ්ව විද්‍යාල පණතේ අංක 107(ආ) වගන්තියද, එසේම ඉන් පසුව පනවන ලද නීති අනුව කරන ලද සංශෝධන ප්‍රකාරව හා අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව සකස් කොට ඇත .

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 ගිණුම්කරණ පදනම

මෙම ආයතනයේ ගිණුම්කරණ ප්‍රකාශන පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ශිල්පීය ආයතනය විසින් නියම කොට ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවී සකස් කරනු ලැබේ. ගිණුම්කරණ කටයුතුවලට බලපාන්නා වූ උද්ධමනාත්මක සාධකවලට (Inflationary factors) ගැලපීම් කොට නොමැත .

### 2.11. ආයතනයට අදාල මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 19 සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) සම්බන්ධ i සහ ii වෙළුම ප්‍රකාරව සකස් කොට ඇත .

## 3. දේපළ යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න

3.1. දේපළ හා යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න පිරිවැයේ අගයට අනුව සඳහන් කොට ඇති අතර ක්ෂය වීම් 1995 ඔක්තෝම්බර් 05 දිනැති අංක 649 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව ඉදිරිපත් කොට ඇත.PPE සඳහා වන ක්ෂයවීම් අගය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව තීරණය කොට ඇත .

**දේපළ යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න ක්ෂය වීමේ අගය (වර්ෂයකට ප්‍රතිශතයක් ලෙස)**

| | |
|---|---|
| 1. ගොඩනැගිලි හා ව්‍යුහ | 05 |
| 2. කාර්යාලීය උපකරණ | 20 |
| 3. නිවාස ව්‍යාපෘතිවලට අදාල උපකරණ | 20 |
| 4. ගෘහභාණ්ඩ හා මෙවලම් | 10 |
| 5. රසායනාගාර ඉගැන්වීම් හා කාර්යාලීය උපකරණ | 20 |
| 6. රථවාහන | 20 |

7. පුස්තකාල පොත් හා වාර සඟරා 20
8. නිවාස ව්‍යාපෘති 10

යම් වත්කමක් භාවිතයට ගැනීමේ ආරම්භයත් සමගම එය ක්ෂය වීමට පටන් ගන්නා අතර, එකී වත්කම විකිණීමට හෝ භාවිතයෙන් ඉවත්කිරීමට තීරණය කරන දිනට පෙර එම ක්ෂවීම් නවතී.

3.2 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය පිහිටා ඇති භූමිය නීත්‍යානුකූලව එම ආයතනයට පවරා නොමැත.එබැවින් එම ඉඩමේ වටිනාකම ගිණුම්වලට ගෙන නොමැත .

**4. ජංගම වත්කම්**

ජංගම වත්කම් යනු ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ හෝ එකී ආයතනයේ ශේෂ පත්‍රයේ සඳහන් කොට ඇති දින සිට වර්ෂයක් තුළ, අදාළ ආයතනයේ ශේෂ පත්‍රයේ ඇති මුදල් සහ ද්‍රවසීලතාවයෙන් යුතු සියලු වත්කම්ය.

**4.1 බඩු වට්ටෝරු පොත් සහ/තොග**

බඩු වට්ටෝරු පොත් සහ තොගවල වටිනාකම නියම පිරිවැයට අනුකූලව තක්සේරු කරනු ලැබේ.ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කිරීමේ පදනම (first in first out basis) මත පිරිවැය ගණනය කරනු ලැබේ.

**4.2 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ඇස්තමේන්තුගත උපලබ්ධි විය හැකි ප්‍රමාණයන්ගෙන් සටහන් කරනු ලැබේ. 2013 දෙසැම්බර් මස 31 දිනට කාර්ය මණ්ඩලයෙන් අය කර ගැනිමට තිබූ ණය මුදල් ශේෂය ලැබීමට තිබෙන ණය ලෙස සලකනු ලැබේ. 2008 -2013 කාල වකවානුවේදී සක්‍රිය ලෙස සිය අධ්‍යයනය කටයුතු කරගෙන යන ලද සිසුන් සැලකිල්ලට ගනිමින් එකී කාලය තුළ එම සිසුන්ගෙන් අයවිය යුතු පාඨමාලා ගාස්තු හා ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු ගණනය කර ඇත. එසේ කිරීමේදී අදාළ අධ්‍යයන කටයුතු නියමිත පරිදි අඛණ්ඩව සිදු නොකළ හා තමා විසින්ම තීරණය කරන ලදුව සිය අධ්‍යයන පාඨමාලා අතර මග නවතා දැමූ සිසුන්ගෙන් ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 අනුව අයවිය යුතු මුදල් ගිනුම්කරණ කටයුතුවලදී නොසලකා හරින ලදී. මක්නිසාද යත් එම මුදල් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවක් පැවතීම එසේ නොසලකා හැරීමට හේතු වී ඇත . එක් එක් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා නියම කොට ඇති කාලය පදනම් කරගෙන පාඨමාලා ගාස්තු වලින් ලැබීමට නියමිත ආදායම ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| විද්‍යාපති (M.Sc) උපාධිය | වසර 1 1/2 |
| දර්ශනපති(M.Phil) උපාධිය | වසර 2 |
| ව්‍යාපාර පරිපාලන පිලිබඳ පශ්චාත් උපාධිය (MBA) | වසර 2 1/ 2 |
| දර්ශන ශූරි (Ph.D) උපාධිය | වසර 3 |

### 4.3 මුදල් හා මුදල් සමාන දෑ (cash and cash equivalence)

මුදල් ශේෂයන්ගෙන් සහ ඉල්ලුම් තැන්පතුවලින් මුදල් හා මුදල් සමතුලිතතාව සමන්විත වේ.

## 5. වගකීම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රයක ජංගම වගකීම් යනුවෙන් දක්වා ඇති වගකීම් වන්නේ එහි ශේෂ පත්‍රයේ සඳහන් කොට ඇති දින සිට වර්ෂයක් තුළ ඉල්ලූ විට ගෙවිය යුතු ගෙවීම්ය. ශේෂ පත්‍රයේ සඳහන් කොට ඇති දින සිට වර්ෂයකට වැඩි කාලයක් තුළ ගෙවීමට බැඳී සිටින ගෙවීම් ජංගම වත්කම් ලෙස හැඳින්වේ.මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී මෙම සියලුම වගකීම් ගණනය කොට ඇත .

### 5.1 සේවා නියුක්තිකයන්ට ගෙවන ප්‍රතිලාභ

### 5.1.1 නිත්‍ය දායකත්ව සැලසුම්

ආයතනයක් අරමුදල් දෙකකට ගෙවනු ලබන ස්ථාවර දායකත්ව මුදල් පදනම්කරගෙන සේවයෙන් විශ්‍රාම ගිය පසු සේවා නියුක්තිකයන්ට ප්‍රතිලාභ ගෙවනු ලබන සැලැස්මකි.(Post EmploymentBenefit Plan) මෙසේ ගෙවීමේදී වැටුපෙන් ස්ථාවර අනුපාතයක් ගෙවනු මිස එය අභිබවා ගෙවීමට නීතිමය බැඳීමක් නැත. සියලුම සේවා නියුක්තිකයන් ආවරණය වන පරිදි සේවක අර්ථසාදක අරමුදලට ගෙවීමට ඇති බැඳීම් උපයන ලද ලාභ හා ලාභ ලැබීම උදෙසා කරන ලද වියදම් යනුවෙන් හැඳින්වේ.

කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය විසින් සිය සේවා නියුක්තිකයන්ගේ දළ වැටුපෙන් සේවා නියුක්තිකයන්ගේ අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිලිවෙලින් 15% හා 3% ක් ගෙවනු ලැබේ.

### 5.1.2 නිත්‍ය ප්‍රතිලාභ සැලසුම්

නිත්‍ය ප්‍රතිලාභ සැලැස්මක් යනු සේවා නියුක්තිකයන් විශ්‍රාම ගැනීමෙන් පසුව ඔවුනට ප්‍රතිලාභ ලබා දීම උදෙසා නිත්‍ය දායකත්ව සැලසුමකට අමතරව තිබෙන ප්‍රතිලාභ සැලැස්මකි. සේවා නියුක්තිකයින්ගේ ප්‍රතිලාභ පිළිබඳ ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුකූලව සියලුම සේවා නියුක්තිකයන් සඳහා සේවයට ඇතුළත් වූ පළමු වසරේ සිටම විශ්‍රාම පාරිතෝෂික ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබේ. කෙසේ වුවද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පණතට අනුව යම් සේවා නියුක්තිකයෙකු හට එකී ගෙවීම් කිරීමට හැකියාව ඇත්තේ ඔහු හෝ ඇය වසර 05ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.

### වෙළඳ හා ගෙවිය යුතු වෙනත් දෑ

වෙළඳ හා ගෙවිය යුතු වෙනත් දෑ එහි පිරිවැය වශයෙන් සකස් කොට ඇත .

## 6.අසම්භාව්‍ය බැරකම් හා වත්කම්

2013.12.31 දිනට කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වගකීම් හෝ වත්කම් හඳුනාගෙන නොතිබුණි.

## 7. මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය

7.1 වර්ෂය

තුළ අතිරික්ත ආදායමක් පැවති බැවින් කාර්යක්ෂම ලෙස ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී හා මූලධන වත්කම් පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් අදාල වසරේ ආදායමට ආරෝපණය කොට ඇත.

7.2 ව්‍යාපාරයක් සිය ආදායම් උත්පාදනය කිරීමේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී වත්කම් අත්පත් කරගැනීමට වැඩිකර ගැනීමට හා ඒවා වැඩි දියුණු කිරීම පිණිස කරනු ලබන වියදම් මූලධන වියදම් වශයෙන් හැඳින්වේ.

## 8. බදුකරණය

2006 අංක 10 දරන දේශිය ආදායම් පණතේ 7(ආ)(v) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කොට ඇත.

## 9. රජයේ ප්‍රතිපාදන

ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව මූලධන ප්‍රවේශය පදනම් කොටගෙන මූලධන වියදම් සඳහා වූ රජයේ ප්‍රතිපාදන ගිණුම්ගත කරනු ලැබේ.

| විස්තරය | වෙන් කරන ලද ප්‍රමාණය (රුපියල්) | නිදහස් කරන ලද ප්‍රතිපාදන(රුපියල්) | ශේෂය (රුපියල්) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 19,028,000 | 19,000,000 | |
| ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම්<br>1. ගොඩනැගිලි<br>2. වාහන<br>3. උපකරණ<br>4. වෙනත් | 6,800,000 | 6,706,000 | |
| වත්කම් අත්පත් කරගැනීම<br>1. පොත් හා වාර සඟරා<br>2. කාර්යාලයීය හා රසායනාගාර උපකරණ<br>3. කාර්යාලයීය උපකරණ | 2,406,000 | 2,500,000 | |
| එකතුව | 9,206,000 | 9,206,000 | |

**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

**2013 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | Note | 31/12/2013 දිනට | | 31/12/2012 දිනට | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| **ජංගම වත්කම්** | | | | | |
| a) මුදල් හා මුදල් සමාන දෑ | 01 | 2,737,775 | | 87,708,619 | |
| b) කෙටි කාලීන ආයෝජන | 02 | 7,000,000 | | 6,500,000 | |
| c) වෙළඳ හා වෙනත් ලැබීම් | 03 | 35,002,255 | | 1,860,057 | |
| d) බඩු වට්ටෝරු පොත් තොග | | 1,190,287 | | 1,414,655 | |
| e) පාඨ ග්‍රන්ථ සහ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රකාශ | | 1,754,552 | | 1,961,995 | |
| f) පෙර ගෙවුම් | 04 | 1,050,692 | | 535,660 | |
| g) ණය හා අත්තිකාරම් | 05 | 4,993,288 | | 5,408,313 | |
| h) වෙනත් මූල්‍ය වත්කම් | | 157,800 | **53,886,648** | 157,800 | **105,547,099** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| (a) ආයෝජන | 06 | 201,537,854 | | 83,863,421 | |
| (b) දේපළ/යන්ත්‍රෝපකරණ | 07 | 58,809,240 | **260,347,094** | 54,988,284 | **138,851,705** |
| **මුළු වත්කම්** | | | **314,233,742** | | **244,398,804** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| (a) පූර්ව ආදායම් | 08 | 2,597,950 | | - | |
| (b) විලම්භිත ආදායම් | 09 | 18,245,711 | | - | |
| (c) ගෙවිය යුතු දෑ | 10 | 14,522,988 | | 15,803,224 | |
| *(d) උපචිත වියදම් ප්‍රතිපාදන* | *11* | *24,374,080* | ***59,740,730*** | 24,740,967 | **40,544,190** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| (a) විලම්භිත ආදායම් | 09 | 2,585,967 | | - | |
| (b) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 12 | 9,788,833 | **12,374,799** | 9,558,573 | **9,558,573** |
| **මුළු වගකීම්** | | | **72,115,529** | | **50,102,763** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **242,118,213** | | **194,296,041** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| කාර්ය මණ්ඩල විලම්භිත ණය ප්‍රතිලාභ | | 2,139,229 | | 2,253,046 | |
| සේවක ණය සඳහා වන විලම්භිත ණය ප්‍රතිලාභ | | (2,139,229) | - | (2,253,046) | |
| සමුච්චිත අරමුදල | 13 | 45,840,216 | | 39,122,706 | |
| අතිරික්තය (හිගය) - ඉ/ගෙ | 14 | 184,767,513 | | 143,388,207 | |
| නිශ්චිත අරමුදල් | 15 | 11,510,484 | **242,118,213** | 11,785,128 | **194,296,041** |
| **මුළු ශුද්ධ වත්කම /හිමිකම්** | | | **242,118,213** | | **194,296,041** |

**මහාචාර්ය ඩී.ඒ.එන් ධර්මසේන**
**වැඩබලන අධ්‍යක්ෂ/ගණන් දීමේ නිලධාරි**

**බී.පී.එස්.පී ජයකොඩි**
**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි**

## කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
## පේරාදෙණිය විශ්ව විද්‍යාලය

### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා විස්තෘත ආදායම්

| | Note | 2013.12.31 දිනට<br>Rs. | 2013.12.31 දිනට<br>Rs. |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | | 19,000,000 | 15,400,000 |
| අභ්‍යන්තර ආදායම් | 16 | 87,288,434 | 65,974,956 |
| රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය කිරීම | | 5,988,490 | 6,631,963 |
| | | **112,276,923** | **88,006,919** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක වැටුප් | 17 | 39,907,916 | 39,408,203 |
| ගමන් වියදම් | 18 | 90,183 | 69,593 |
| පැපයුම් හා පරිභෝජන | 19 | 3,303,068 | 2,992,028 |
| නඩත්තු | 20 | 1,239,819 | 737,389 |
| ගිවිසුම්ගත සේවා | 21 | 5,448,947 | 5,158,518 |
| පර්යේෂණ හා සංවර්ධන | | | - |
| ක්ෂයවීම් | 22 | 8,898,590 | 8,771,214 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 23 | 19,137,868 | 9,598,707 |
| මුළු මෙහෙයුම් වියදම් | | **78,026,391** | **66,735,651** |
| **අදාල වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (හිගය)** | | **34,250,532** | **21,271,268** |
| **වෙනත් විස්තෘත ආදායම්** | | | |
| හුවමාරු ලැබීම්/ විදේශ හුවමාරු කටයුතුවලදී සිදුවූ පාඩු | | | |
| නැවත තක්සේරු කරන ලද අතිරික්තය | | | |
| Gain/loss on fair value re-measurement of available | | | |
| ආයු හිනක ප්‍රතිලාභ/ විශ්‍රාම සැලසුම් මත පාඩු | | | |
| **වෙනත් විස්තෘත ආදායම්** | | **34,250,532** | **21,271,268** |
| | | - | - |
| **මුළු විස්තෘත ආදායම්** | | **34,250,532** | **21,271,268** |

මහාවාර්ය ඩී.ජ්.එන් ධර්මසේන
වැඩබලන අධ්‍යක්ෂ/ගණන් දීමේ නිලධාරි

බී.පී.එස්.පී ජයකොඩි
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි

## කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

## 2013 දෙසැම්බර් මස 31 දිනට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා මුදල් ඒකක දහස්

| | සමුච්චිත අරමුදල | සංචිත නැවත තක්සේරු කිරීම | ෂංචිත පරිවර්ත ණය කිරීම | එකතුව |
|---|---|---|---|---|
| **2011දෙසැම්බර් 31 දිනට ශේෂය** | 190,079,109 | - | - | 190,079,109 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කම් | - | | | |
| Restated balance | | | | |
| | **190,079,109** | - | - | **190,079,109** |
| දේපළ ප්‍රතිප්‍රමාණ කළ පසු අතිරික්තය | - | - | | - |
| ආයෝජන ප්‍රතිප්‍රමාණ කිරීමේදී පෙන්වූ හිගය | | | | |
| ව්‍යවහාර මුදල් ප්‍රතිප්‍රමාණ කිරීමේ වෙනස්කම් | | - | - | - |
| ස්ථාවර වත්කම්වල වටිනාකම මත රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය කිරීම | (6,631,963) | | | |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රමාණයේ ඇති හඳුනා නොගත් ශුද්ධ ප්‍රතිලාභ හා පාඩු | (10,422,373) | | | (10,422,373) |
| අදාල වර්ෂයේ පැවති අතිරික්තය (හිගය) | 21,271,268 | - | - | 21,271,268 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **194,296,041** | - | - | **194,296,041** |
| දේපළ නැවත තක්සේරු කළ පසු හිගය | | | | |
| ආයෝජන නැවත තක්සේරු කළ පසු අතිරික්තය | | - | | - |
| මුදල් පරිවර්තන වෙනස්කම් | | | - | - |
| ස්ථාවරවත්කම්වල අගය මත රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය කිරීම | (5,988,490) | | | |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ හඳුනා නොගත් | | | | - |
| ශුද්ධ ලැබීම් හා පාඩු | 19,560,129 | - | - | 19,560,129 |
| උදාල කාලය සඳහා අතිරික්තය(හිගය) | 34,250,532 | - | - | 34,250,532 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **242,118,213** | - | - | **242,118,213** |

**මහාචාර්ය ඩී.ජ්.එන් ධර්මසේන**
**වැඩබලන අධ්‍යක්ෂ/ගණන් දීමේ නිලධාරි**

**බී.පී.එස්.පී ජයකොඩි**
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි**

## කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

### 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වන විසර්ජන ගිනුම

| | 2013 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| ඉ/ගෙ වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය | 34,250,532 | 21,271,268 |
| පසු ගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | 143,388,207 | 146,662,940 |
| | **177,638,740** | **167,934,208** |
| **එකතු කළා** | | |
| 01. පසුගිය වර්ෂයට අදාළ ආදායම | 25,281,815 | 95,450,621 |
| 02. වෙනත් ගැළපුම් - බැර | - | - |
| | **202,920,554** | **263,384,829** |
| **අඩු කළා** | | |
| 01. ගැළපුම් - සමුච්චිත ක්ෂය වීම් | | - |
| 02. පසුගිය වසරට අදාළ ගෙවීම් | 14,653,041 | 111,818,349 |
| 03. ගැළපුම් - හර | | |
| 04. ආදායමෙන් හා පොදු සංචිතයෙන් දරන ලද මූලධන වියදම් | 3,500,000 | 8,178,273 |
| | 18,153,041 | 119,996,621 |
| | **184,767,513** | **143,388,207** |

**මහාචාර්ය ඩී.ජ්.එන් ධර්මසේන**
**වැඩබලන අධ්‍යක්ෂ/ගණන් දීමේ නිලධාරි**

**බී.ජී.එස්.පී ජයකොඩි**
**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි**

**වක්‍ර ක්‍රමයට අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

**කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය**

**කෘෂිකර්ම පශ්චාත උපාධි ආයතනය 2013 දෙසැම්බර් 31 වන දිනෙන අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**රුපියල් "000"**

| මෙහෙයුම් කටයුතු මුදල් ප්‍රවාහය | **2013 Actual** රුපියල් | **2012 Actual** රුපියල් |
|---|---|---|
| සාමාන්‍ය කටයුතුවලින් ඉත්පසු අතිරික්තය (හිගයි) | 34,251 | 21,271 |
| මුදල් නොවන ප්‍රවාහයන් | **34,251** | **21,271** |
| දේපල හා යන්ත්‍රෝපකරණවල ක්ෂය වීම් | 8,899 | 8,771 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 1,001 | 1,254 |
| ආයෝජනවලින් ලද පොලිය | (27,732) | (16,698) |
| පෙර වර්ෂයේ ගැලපුම් | 9,577 | (16,421) |
| **කාරක ප්‍රාග්ධන වැඩිවීම් හා අඩුවීම්** | | |
| බඩු වට්ටෝරු පොත්වල (වැඩිවීම්/අඩුවීම්) | 432 | (1,415) |
| සේවා නියුක්තිකයින් සඳහා දැරිය යුතු වියදම් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන (වැඩිවීම/අඩුවීම) | - | - |
| ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම) | 22,747 | 22,949 |
| දේපල හා යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලද ලාභය/(පාඩුව) | - | |
| ආයෝජන වලින් ලද ලාභය/(පාඩුව) | (118,174) | (47,050) |
| වෙනත් ජංගම වත්කම්වල වැඩිවීම/(අඩුවීම) | 415 | (280) |
| වෙළඳ හාවෙනත් ලැබීම්වල වැඩිවීම/(අඩුවීම) | (33,657) | (1,266) |
| රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය කිරීම | (5,988) | (6,632) |
| | **(108,231)** | **(35,516)** |
| **මෙහෙයුම් කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහනය** | | |
| දේපල හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | (4,973) | (12,013) |
| දේශන ශාලා සංකීර්ණය ප්‍රතිසංස්කරණ වියදම් | - | - |

| | | |
|---|---|---|
| | (8,430) | (268) |
| වෙනත් මූල්‍ය වත්කම් | - | (75) |
| ආයෝජන මත පොලිය | 27,732 | 16,698 |
| **ආයෝජන කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **14,329** | **4,342** |

| | | |
|---|---|---|
| **මූල්‍යයන කටයුතුවල මුදල් ප්‍රවාහ** | | |
| ආයෝජන ඉවත් කර ගැනීම | 9,206 | 4,000 |
| ආයෝජන ඉවත් කර ගැනීම | - | - |
| පාරිතෝෂික ගෙවීම් | - | |
| ස්වයං අරමුදල් සම්පාදිත ව්‍යාපෘති(ශුද්ධ වටිනාකම) | (275) | 2,033 |
| මූල්‍යයන කටුයතුවල ශුද්ධ මුදල් ප්‍රවාහය | **8,931** | **6,033** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | **(84,971)** | **(25,140)** |
| අදාල වර්ෂය ආරම්භයේදි තිබූ මුදල් හා මුදල් සමාන දෑ | 87,709 | 112,849 |
| අදාල වර්ෂය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ | 2,738 | 87,709 |
| මුදල් හා මුදල් සමාන දෑවල සිදු වූ ශුද්ධ වැඩිවීම් | **(84,970.84)** | **(25,140)** |

**මහාචාර්ය ඩී.ජ්.එන් ධර්මසේන**
**වැඩබලන අධ්‍යක්ෂ/ගණන් දීමේ නිලධාරි**

**බී.ජී.එස්.පී ජයකොඩි**
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි**

| | 2013 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| **01. මුදල් හා මුදල් ප්‍රවාහයන්** | | |
| **බැංකු ශේෂය** | | |
| මහජන බැංකුව ගිණුම් අංක 057100131338027 | (156,574.70) | 8,855,012.26 |
| මහජන බැංකුව ගිණුම් අංක 057100131338032 | 1,504,552.56 | 273,496.08 |
| ලංකා බැංකුව ගිණුම් අංක 0001273337 | 1,278,119.39 | 3,424,433.51 |
| මහජන බැංකුව ගිණුම් අංක 057-1-002-20000258 | 111,677.48 | 155,677.48 |
| පර්යේෂන ගිණුමට අරමුදල් මාරු කිරීම | | 75,000,000.00 |
| **එකතුව** | **2,737,774.73** | **87,708,619.33** |

2013 දෙසැම්බර් 31 දිනට ඉහත බැංකු ගිණුම්වල පැවති ශේෂය අදාල මුදල් පොත් සමග සංසන්දනය කරන ලදී.

| | 2013 | 2012 |
|---|---|---|
| **02. කෙටිකාලීන ආයෝජන** | | |
| කාලීන තැම්පතු --පුනරාවර්තන (No 257600100010403-0) | 2,000,000.00 | 2,000,000.00 |
| කාලීන තැම්පතු - පර්යේෂන ගිණුම (73272662 ) | 5,000,000.00 | 2,500,000.00 |
| කාලීන තැම්පතු - මූලධන ගිණුම | - | 2,000,000.00 |
| **එකතුව** | **7,000,000.00** | **6,500,000.00** |
| **එකතුව** | **9,737,774.73** | **94,208,619.33** |

| | 2013 | 2012 |
|---|---|---|
| **3 වෙළඳ හා වෙනත් ලැබීම් (උපලේඛනය ආ)** | | |
| පොලී ලැබීම් | 15,490,370.25 | 1,860,037.00 |
| දේශන ගාස්තු ලැබීම් | 11,784,638.09 | - |
| ලියාපදිංචි හා වෙනත් ගාස්තු ලැබීම් | 7,586,386.74 | |
| බැංකු විසින් ආපසු එවන ලද චෙක්පත් | 20.00 | 20.00 |
| දේපල ණය වලින් ලැබූ පොලිය | 60,839.46 | |
| ලැබූ ආදායම | 80,000.00 | |
| **එකතුව** | **35,002,254.54** | **1,860,057.00** |

| | 2013 | 2012 |
|---|---|---|
| **04. පෙර ගෙවුම් චාර සගරා** | | |
| මාර්ගස්ථ නොග(පොත් අන්තිකාරම්) | 943,825.60 | 260,310.21 |
| පෙර ගෙවුම් | 106,866.25 | 275,349.67 |

| | 2013 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| **05. ණය හා අත්තිකාරම් (උපලේඛනය - ආ)** | | |
| **කාර්ය මණ්ඩලය සඳහා දෙන ලද ණය හා අත්තිකාරම්** | | |
| 1. කාර්ය මණ්ඩල ණය | 66,810.00 | 80,750.00 |
| 2. ආපදා ණය | 4,124,061.99 | 4,514,447.99 |
| 3. ප්‍රවාහන ණය | 418,416.00 | 569,240.00 |
| 4. උත්සව අත්තිකාරම් | 8,500.00 | 6,750.00 |
| 5. පරිගණක ණය | 375,500.00 | 237,125.00 |
| 6. වැටුප් අත්තිකාරම් | - | - |
| **එකතුව** | **4,993,287.99** | **5,408,312.99** |
| **විවිධ අත්තිකාරම්** | | |
| 1. පර්යේෂණ ප්‍රතිපාදන අත්තිකාරම් | - | - |
| 2. සාමාන්‍ය අත්තිකාරම් | - | - |
| 3. ප්‍රාග්ධන අත්තිකාරම් | - | - |
| | - | - |
| **එකතුව** | **4,993,287.99** | **5,408,312.99** |

<u>**06 - ආයෝජන කෙටි කාලීන**</u>

| | 2013 | 2012 |
|---|---|---|
| **ඉතිරිකිරීම් තැන්පතු** | | |
| **1. ලංකා බැංකු ඉතිරිකිරීමේ ගිණුම :** | | |
| කෘ.ප.උ.ආ.පර්යේෂණ අරමුදල් ඉතිරි කිරීමේ ගිණුම් අංක. 1280803 | 147,644.79 | 141,865.04 |
| ලෝක වන ජීවී අරමුදල් ඉතිරි කිරීමේ ගිණුම් අංක. 1282692 | - | - |
| **2. මහජන බැංකු ඉතිරිකිරීමේ ගිණුම:** | | |
| කෘ.ප.උ.ආ ඉතිරි කිරීමේ ගිණුම් අංක 057-2-001-3-1360625 | 184,064.67 | 175,137.69 |
| ශිෂ්‍යයන් සඳහා වූ ශිෂ්‍යත්ව අරමුදල්ගිණුම් අංක 057-2-001-7-1360628 | - | - |
| ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වනගිණුම් අංක 057-2-001-3-1993699 | 280,750.16 | 267,133.99 |
| | 612,459.62 | 584,136.72 |
| ස්ථාවර තැම්පතු (උපලේඛනය - ඇ) | | |
| **ඉතිරිකිරීම් අංකය හා බැංකුව** | | |
| 1. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක . 346483 (57600100003911-0) | 13,404,038.43 | 11,757,928.45 |
| 2. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 783532 (057600100003001-1) | 1,000,000.00 | 1,000,000.00 |
| 3. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක.567898 (05760010000230209) | 300,000.00 | 300,000.00 |
| 4. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක 964239 (05760-01-000106065) | 5,000,000.00 | - |
| 5. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 057-60-01-00010954-3 | 3,000,000.00 | - |
| 6. ස්ථාවර තැම්පතු ලංකා බැංකුව අංක. 773545 (2-001585-1) | 1,416,355.69 | 1,416,355.69 |
| 7. ස්ථාවර තැම්පතු ලංකා බැංකුව අංක . 8826295 | 6,600,000.00 | 6,600,000.00 |
| 8. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 57600100009281-9 | 10,000,000.00 | 10,000,000.00 |
| 9. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක 57600100009545-1 | 29,700,000.00 | 29,700,000.00 |
| 10. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක 57600100008453-3 | 5,000,000.00 | 5,000,000.00 |
| 11. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 57600100010019-6 | 12,500,000.00 | 12,500,000.00 |
| 12. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 57600100010401-2 | - | 5,000,000.00 |
| 13. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක 057600100011492-0 | 8,000,000.00 | |
| 14. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 57600100010436-1 | 5,000.00 | 5,000.00 |
| 15. ස්ථාවර තැම්පතු ලංකා බැංකුව අංක 74187080 | 75,000,000.00 | |
| 16. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක. 57600100010799.2 | 25,000,000.00 | |
| 17. ස්ථාවර තැම්පතු මහජන බැංකුව අංක 57600100011561-6 | 5,000,000.00 | |
| | **200,925,394.12** | **83,279,284.14** |
| **එකතුව** | **201,537,853.74** | **83,863,420.86** |

## මූල්‍යප්‍රකාශනයටඅදාල සටහන්

07. දේපළ හා යන්ත්‍රෝපකරණ

| | ඉඩම් හා ගොඩනැගිලි | ගෘහඋපකරණ හා මෙවලම් | කාර්යාලීයඋපකරණ | රථවාහන | දුරකථන | පුස්තකාල පොත්සහවාර සගරා | නිවාස වෘත්තී උපකරණ | රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| පිරිවැය<br>2013 ජනවාරි 01 දිනට | 65,308,306.90 | 1,580,327.80 | 7,262,330.75 | 14,495,000.00 | 34,915.17 | 33,688,599.27 | 490,748.65 | 44,488,868.94 | 167,349,097.48 | 167,349,097.48 |
| අඩුකලා /එකතු කලා ගැලපුම් එකතු කිරීම් | 8,430,449.45 | 74,707.49 | 3,901,496.00 | | | 312,893.22 | | | 12,719,546.16 | - |
| **2013 දෙසැම්බර් 31 දිනටපිරිවැය** | 73,738,756.35 | 1,655,035.29 | 11,163,826.75 | 14,495,000.00 | 34,915.17 | 34,001,492.49 | 490,748.65 | 44,488,868.94 | 180,068,643.64 | 167,349,097.48 |
| **අඩුකලා ක්ෂයවීම්** | | | | | | | | | | |
| 2013 ජනවාරි 01 දානටසමුච්චිත ක්ෂයවීම් | 26,216,974.46 | 1,183,577.80 | 4,482,707.38 | 6,438,267.76 | 34,915.17 | 31,777,392.55 | 490,748.66 | 41,736,229.72 | 112,360,813.50 | 112,360,813.50 |
| පෙරවසරේ ගැලපුම් | | | 154,505.05 | | | | | (154,505.05) | | - |
| ආදායම් සහ වියදම් ගිණුමට අයකලා | 3,229,789.20 | 136,243.55 | 931,918.29 | 2,449,000.00 | - | 903,000.87 | | 1,248,637.79 | 8,898,589.70 | |
| 2013 දෙසැම්බර් 31 දිනටසමුච්චිත ක්ෂයවීම් | 29,446,763.66 | 1,319,821.35 | 5,569,130.72 | 8,887,267.76 | 34,915.17 | 32,680,393.42 | 490,748.66 | 42,830,362.46 | 121,259,403.20 | 112,360,813.50 |
| **2013 දෙසැම්බර් 31 දිනටපැවතිශුද්ධපොත්අගය** | **44,291,992.69** | **335,213.94** | **5,594,696.03** | **5,607,732.24** | **-** | **1,321,099.07** | **-** | **1,658,506.48** | **58,809,240.44** | **54,988,283.98** |

38

| | 2013 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| **08. අත්තිකාරකම් ආදායම්** | | |
| 1. පාඨමාලා ගාස්තු ආදායම් අත්තිකාරකම් ගිණුම | 2,597,950.00 | - |
| | **2,597,950.00** | **-** |
| **09. විලම්භිත ආදායම** | | |
| 1. විලම්භිත ලියාපදිංචි ගාස්තු හා වෙනත් ආදායම් | 481,911.40 | |
| 2. විලම්භිත දේශන ගාස්තු ආදායම | 20,349,766.67 | |
| | **20,831,678.07** | **-** |
| **10.ගෙවීම් (උපලේඛනය - ඇ) ඉතිරි කිරීම්** | | |
| 1. විද්‍යා තැම්පතු | 3,327,566.78 | 4,722,866.78 |
| 2. පුස්තකාල තැම්පතු | 10,091,307.00 | 9,835,591.00 |
| 3. ටෙන්ඩර් තැම්පතු | 44,492.00 | 44,492.00 |
| 4. රඳවා ගන්නා ලද ගාස්තු ආපසු ගෙවීම් | 711,653.63 | 235,848.10 |
| | **14,175,019.41** | **14,838,797.88** |
| 5. අවලංගු කරන ලද චෙක්පත් | 100,853.00 | 152,888.00 |
| 6. විදේශිය සිසුන්ගේ පර්යේෂණ අරමුදල | 83,340.01 | 83,340.01 |
| 7. වෙනත් (ඇප මුදල්) | 1,668.00 | 1,668.00 |
| 8. ණය කරුවන්ගේ ගිණුම හෙළදිව ග්ලාස් හවුස් | - | 721,530.00 |
| 9. වෙනත් ඉතිරිකිරීම් - ඩී.පී.එන්.පී පෙරේරා | 5,700.00 | 5,000.00 |
| 10. ණය කරුවන්ගේ ගිණුම රජයේ වාණිජ නිතිගත සංස්ථාව | 156,408.00 | |
| | **14,522,988.42** | **15,803,223.89** |
| **එකතුව** | **37,952,616.49** | **14,838,797.88** |

| | 2013 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| **11. උපචිත වියදම්** | | |
| 1. බාහිර කථිකාචාර්යවරුන් සඳහා ගෙවීම් | 19,036,813.00 | 20,987,698.00 |
| | 134,600.00 | 192,500.00 |
| 3. විභාග කටයුතු | 629,467.54 | 185,153.50 |
| 4. ඉන්ධන සැපයුම් | 20,521.92 | 15,711.80 |
| 5. සන්නිවේදන කටයුතු | | |
| 6. නිවාඩු දින ගෙවීම් | 134,160.40 | 105,894.77 |
| 7. රසායනික ද්‍රව්‍ය සැපයීම් | 9,054.00 | 11,493.50 |
| 8. විදුලි බිල්පත් ගෙවීම | - | 513,814.14 |
| 9. නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම | 293,726.14 | 88,281.60 |
| 10. ගමන් වියදම් | 52,082.30 | - |
| 11. අතිකාල | 5,700.00 | 3,250.00 |
| 12. උපකරණ අලුත්වැඩියා කටයුතු | 172,943.00 | 188,782.00 |
| 13. කථිකාචාර්යවරුන් සඳහා ප්‍රවාහන දීමනා | 3,998.40 | - |
| 14. ලිපිද්‍රව්‍ය සැපයුම් | | |
| 15. සනීපාරක්ෂක සේවා | 145,464.00 | 53,128.00 |
| 16. වාර්ෂික සම්මේලනය සඳහා වියදම් | 6,978.50 | 34,188.00 |
| 17. වාහන අලුත් වැඩියා කටයුතු | 122,795.68 | 70,560.00 |
| 18. මුද්දර ගාස්තු | 452,196.78 | - |
| 19. වැටුප් හා වේතන | - | 12,540.00 |
| 20. අර්ථසාධක අරමුදල | 4,850.00 | 10,750.00 |
| 21. සේවක භාරකාර අරමුදල | 396,810.00 | 33,625.00 |
| 22. නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම් | 8,100.00 | - |
| 23. වෙනත් සැපයුම් | 972.00 | - |
| 24. කුලී සහ ගාස්තු | 10,830.00 | 11,480.00 |
| 25. ප්‍රවාහන වියදම් | 9,460.00 | 2,875.00 |
| 26. ආරක්ෂක වියදම් | 3,120.00 | 780.00 |
| 27. ජල බිල්පත් ගෙවීම | - | 16,463.21 |
| 28. පාඨමාලා ද්‍රව්‍ය | 85,400.00 | 128,800.00 |

| | | |
|---|---|---|
| 29. මුද්‍රණ හා ප්‍රචාරක කටයුතු | 305,118.00 | 278,190.00 |
| 30. පර්යේෂන සඳහා පහසුකම් සැලසීමේ අරමුදල | - | 626,758.00 |
| 31. සංයුක්ත සැලසුම් | 30,199.54 | |
| 32. වැඩමුළු හා සම්මන්ත්‍රණ | 392,970.41 | |
| 33. CAP NET ව්‍යාපෘතිය | 150,000.00 | |
| 34. ආචාර්ය ඩී.ඒ.එන් ධර්මසේන (ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපාදන) | 48,748.00 | |
| 35. HETC ව්‍යාපෘතිය ජේ . නිමලන් | 182,000.00 | |
| | 5,160.00 | |
| | 15,000.00 | |
| **එකතුව** | **22,869,239.61** | **23,572,716.52** |
| | **34,162,912.86** | **34,299,539.02** |

**12. ප්‍රතිපාදන**

1. විශේෂ සේවා වෘත්තිකයින් හා වෙනත්(විගණන ගාස්තු)
2. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

| | | |
|---|---|---|
| | 1,504,840.75 | 1,168,250.00 |
| | 9,788,832.50 | 9,558,572.50 |
| | **11,293,673.25** | **10,726,822.50** |

| | 2013 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| **13. සමුච්චිත අරමුදල(උපලේඛනය -ඉ)** | | |
| මූලධන ප්‍රතිපාදන වලින් දරන ලද වියදම් | 48,131,386.43 | 40,638,034.58 |
| වියදම් නොකළ මූලධන ප්‍රතිපාදන | (2,308,628.28) | (1,336,016.18) |
| වියදම් නොකළ මූලධන ප්‍රතිපාදන (ප්‍රතිසංස්කරණ කටයුතු) | 17,457.88 | |
| ආදායමෙන් හා පොදු අරමුදලෙන් මූලධන | - | 78,780.00 |
| එකතුව | 45,840,216.03 | 39,122,705.73 |
| 14. අතිරික්තය/(හිගය) ගිණුමේ ශේෂය | | |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 143,388,207.38 | 146,662,939.85 |
| | | - |
| | 143,388,207.38 | 146,662,939.85 |
| අඩුකලා - වර්ෂය තුළදී කරන ලද ගැලපීම | | |
| 1) පසුගිය වසරේ මූලධන වියදම් සඳහා | | |
| 2) ආදායමෙන් වෙන් කළ මුදල | 3,500,000.00 | 8,178,272.50 |
| 3) සුබසාධන අරමුදල අවලංගු කිරීම | | - |
| 4) පරිගණක අරමුදල අවලංගු කිරීම | | - |
| 5) වෛද්‍ය අරමුදල අවලංගු කිරීම | 10,628,773.54 | (16,367,728.01) |
| 6) පෙර වර්ෂයේ ගැලපීම් | 7,128,773.54 | (24,546,000.51) |
| | 150,516,980.92 | 122,116,939.34 |
| එකතු කලා අදාල වර්ෂය තුළදී කරන ලද ගැලපීම් | 34,250,532.44 | 21,271,268.04 |
| ශේෂය ඉ.ගෙ අතිරික්තය/හිගය | 184,767,513.36 | 143,388,207.38 |
| **15. සීමිත අරමුදල්** | | |
| (c) පර්යේෂණ සඳහා ප්‍රතිපාදන (උපලේඛනය ඊ) | 5,159,987.06 | 5,434,631.68 |
| (d) ත්‍යාග හා ප්‍රදාන (උපලේඛනය - උ) | 6,050,496.54 | 6,050,496.54 |
| (e) වෙනත් | 300,000.00 | 300,000.00 |
| එකතුව | 11,510,483.60 | 11,785,128.22 |

| විෂය | 2013 | | | 2012 |
|---|---|---|---|---|
| | වෙන්කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන | වෙනස | ලැබුණු ප්‍රතිපාදන (2012) |
| **16 වෙනත් ආදායම්** | | | | |
| ණය පොලී | 225,000 | 221,028 | 3,972 | 216,868 |
| ආයෝජනවලින් ලද පොලිය | 13,000,000 | 27,510,894 | (14,510,894) | 16,481,087 |
| සේවක ණය සඳහා වන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ගැලපුම් ගිණුම | - | 356,538 | (356,538) | 375,508 |
| දේපළ වලින් ලැබූ කුලිය | 500,000 | 578,240 | (78,240) | 546,360 |
| පුස්තකාල දායක මුදල් | 550,000 | 749,407 | (199,407) | 557,945 |
| නිෂ්පාදන අලෙවියෙන් ලද ආදායම | - | - | - | - |
| ප්‍රතිපූර්ණය කරන ලද මුදල් | - | - | - | - |
| විවිධ ලැබීම් | 500,000 | 2,670,269 | (2,170,269) | 2,356,943 |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | 8,000,000 | 10,589,942 | (2,589,942) | 6,981,793 |
| දේශන ගාස්තු (පශ්චාත් උපාධි) | 32,000,000 | 34,619,133 | (2,619,133) | 30,758,250 |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | 600,000 | 1,890,500 | (1,290,500) | 604,128 |
| ප්‍රකාශන අලෙවිය | 1,000,000 | 1,007,430 | (7,430) | 1,073,072 |
| පැරනි තොග විකිණීමෙන් ලද ආදායම | 20,000 | - | 20,000 | 31,200 |
| පුස්තකාල දඩ මුදල් | 25,000 | 29,689 | (4,689) | 16,702 |
| වෛද්‍ය ගාස්තු | 50,000 | - | 50,000 | 332,329 |
| ශිෂ්‍ය සුභසාධන ගාස්තු | 50,000 | 23,000 | 27,000 | 389,289 |
| අධීක්ෂන ගාස්තු | - | - | - | 693,815 |
| බාහිර පාර්ශවකරුවන්ට සපයන ලද සේවා | 207,000 | 880,474 | (673,474) | 240,531 |
| අන්තර්ජාල ගාස්තු | - | - | - | 3,322,337 |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ | 2,500,000 | 2,497,586 | 2,414 | 1,169,886 |
| Bench / practicum fees expenses | | - | - | 190,000 |
| වාර්ෂික සම්මේලන ගාස්තු | 2,000,000 | 3,244,430 | (1,244,430) | 1,867,823 |
| පොදු කාර්ය ගාස්තු | 150,000 | 419,874 | (269,874) | 42,256 |
| **Total** | **61,527,000** | **87,288,434** | **(25,761,434)** | **68,248,122** |

| වැය විෂය | 2013 | | | 2012 |
|---|---|---|---|---|
| | වැය විෂය | සත්‍ය වැය | | Actual |
| **17. පුද්ගල පඩිනඩි** | | | | |
| වැටුප් හා වේතන | 13,032,000 | 13,046,273 | (14,273) | 12,583,520 |
| විශ්ව විද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල 15% (විශ්‍රාම වැටුප් නොමැති අය සඳහා) | 1,843,000 | 1,994,756 | (151,756) | 1,157,378 |
| සේවක අර්ථ සාධක අරමුදල 3% | 478,000 | 486,557 | (8,557) | 469,061 |
| විශ්ව විද්‍යාල විශ්‍රාම වැටුප් | 557,000 | 507,122 | 49,878 | 321,357 |
| වැඩ බැලීමේ ගාස්තු | - | - | - | - |
| අධ්‍යයන දීමනා | 943,000 | 1,175,705 | (232,705) | 869,529 |
| පර්යේෂන දීමනා (අධ්‍යයන) | 379,000 | 529,213 | (150,213) | 348,989 |
| විශේෂ දීමනා 15% | 1,890,000 | 2,052,095 | (162,095) | 1,754,275 |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 15,000,000 | 13,024,478 | 1,975,522 | 15,246,638 |
| ජීවන වියදම් දීමනාව | 3,564,000 | 3,247,420 | 316,580 | 3,078,642 |
| අතිකාල | 2,100,000 | 2,165,672 | (65,672) | 1,664,775 |
| නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් ගෙවීම | 200,000 | 193,272 | 6,728 | 115,564 |
| වෙනත් දීමනා | 95,000 | 95,078 | (78) | 86,805 |
| භාෂා ප්‍රවිණතා දීමනා | 72,000 | 32,615 | 39,385 | 81,748 |
| පාරිතෝෂික | 1,050,000 | 1,001,123 | 48,878 | 1,254,415 |
| \කාර්ය මණ්ඩලයට දෙනු ලබන ණය | | 356,538 | (356,538) | 375,508 |
| එකතුව | **41,203,000** | **39,907,916** | **1,295,084** | **39,408,203** |
| **18. ගමන් වියදම්** | | | | |
| ගමන් වියදම් (දේශීය) | 100,000 | 90,183 | 9,817 | 69,593 |
| ගමන් වියදම් (විදේශීය) | - | - | - | - |
| එකතුව | **100,000** | **90,183** | **9,817** | **69,593** |

| | | | | |
|---|---|---|---|---|
| **19. සැපයුම්** | | | | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,200,000 | 1,192,349 | 7,651 | 1,092,341 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 1,250,000 | 1,287,521 | (37,521) | 786,378 |
| මැහුම් කුලී ඇතුළත්ව නිල ඇඳුම් | 75,000 | 64,611 | 10,389 | 26,875 |
| රසායන ද්‍රව්‍ය හා විදුරුභාණ්ඩ | 550,000 | 132,399 | 417,601 | 898,983 |
| වෛද්‍ය සැපයුම් | - | - | - | - |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | - | - | - | - |
| වෙනත් | 550,000 | 626,188 | (76,188) | 256,861 |
| | | | - | |
| එකතුව | **3,625,000** | **3,303,068** | **321,932** | **3,061,437** |

| | | | | |
|---|---|---|---|---|
| **20. නඩත්තු වියදම්** | | | | |
| රථ වාහන | 610,000 | 770,116 | (160,116) | 213,183 |
| යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ | 250,000 | 356,396 | (106,396) | 225,183 |
| ගොඩනැගිලි | 100,000 | 109,307 | (9,307) | 101,600 |
| ගෘහභාණ්ඩ | 25,000 | 4,000 | 21,000 | 69,630 |
| වෙනත් | - | - | | - |
| එකතුව | **985,000** | **1,239,819** | **(254,819)** | **609,596** |

| විෂයය | 2013 | | | 2012 |
|---|---|---|---|---|
| | වෙන්කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන | වෙනස | ලැබුණු ප්‍රතිපාදන (2012) |
| **21.ගිවිසුම් හා සේවා** | | | | |
| ප්‍රවාහන | 225,000 | 134,327 | 90,673 | 151,212 |
| ආරක්ෂක සේවා | 600,000 | 511,000 | 89,000 | 508,620 |
| කුලි හා කුලී ගෙවීම් | 10,000 | 9,360 | 640 | 9,360 |
| සන්නිවේදන ගාස්තු | 1,300,000 | 1,283,014 | 16,986 | 1,195,809 |
| ගැපැල් ගාස්තු | 150,000 | 330,545 | (180,545) | 195,210 |
| විදුලි ගාස්තු | 1,200,000 | 1,198,046 | 1,954 | 1,072,361 |
| සනීපාරක්ෂක සේවා | 950,000 | 969,880 | (19,880) | 823,971 |
| පළාත් පාලන ආයතන සඳහා වරිපණම් ගාස්තු/වැට් බදු ගෙවීම | - | - | - | - |
| ජල බිල්පත් ගෙවීම | 200,000 | 78,840 | 121,160 | 98,286 |
| මුද්‍රණ හා ප්‍රචාරණ කටයුතු | 900,000 | 893,378 | 6,622 | 963,921 |
| වෙනත් | 100,000 | 40,557 | 59,443 | 196,751 |
| එකතුව | **5,635,000** | **5,448,947** | **186,053** | **5,215,501** |
| **22. ස්ථාවර වත්කම් ක්ෂය වීම්** | | | | |
| ගොඩනැගිලි (ව්‍යුහද ඇතුළත්ව) | | 3,229,789 | | 2,913,173 |
| කාර්යාලීය උපකරණ | | 931,918 | | 209,257 |
| රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ | | 1,248,638 | | 2,370,536 |
| පුසතකාල පොත් හා වාර සගරා | | 903,001 | | 844,729 |
| ගෘහභාණ්ඩ හා උපාංග | | 136,244 | | 132,250 |
| රථවාහන | | 2,449,000 | | 2,301,268 |
| **Total** | | **8,898,590** | | **8,771,214** |

| | | | | |
|---|---|---|---|---|
| | | | - | |
| **23. වෙනත් පුනරාවර්තන වියදම්** | | | | |
| විශ්ව විද්‍යාල කථිකාචාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන දීමනා | 1,000,000 | 640,693 | 359,307 | 540,270 |
| විශේප සේවා - විශේෂ සභා සහ කමිටු | 1,400,000 | 1,126,198 | 273,802 | 835,486 |
| විශේප සේවා - වෘත්තිය සහ වෙනත් ගාස්තු | 1,000,000 | 1,170,147 | (170,147) | 761,467 |
| පර්යේපණ හා ප්‍රකාශන | 150,000 | 93,042 | 56,958 | 152,138 |
| කාර්යය මණ්ඩල සංවර්ධනය | 250,000 | 82,750 | 167,250 | 53,250 |
| පශ්චාත් උපාධි පර්යේධණ හා ශිෂ්‍යත්ව | 150,000 | 1,001,873 | (851,873) | 639,682 |
| ශිෂ්‍යයින් සඳහා පාඨමාලා ද්‍රව්‍ය | 5,000,000 | 3,962,926 | 1,037,075 | 1,784,543 |
| හිෂ්‍ය හා සේවක සුබසාධනය | 150,000 | 92,500 | 57,500 | 41,958 |
| නිදහස් දුම්රිය ප්‍රවේශපත්‍ර | 15,000 | 17,050 | (2,050) | 36,020 |
| විනෝද කටයුතු සඳහා වියදම් | 250,000 | 253,199 | (3,199) | 87,523 |
| ක්‍රීඩා කටයුතු | 100,000 | - | 100,000 | 6,250 |
| බැංකු ගාස්තු | 45,000 | 42,855 | 2,145 | 25,178 |
| ප්‍රදාන හා වන්දි පූරණ ගෙවීම් | 25,000 | 12,500 | 12,500 | 17,500 |
| උපාධි ප්‍රධානෝත්සව හා වාර්පික සම්මේලනය | 2,000,000 | 3,391,741 | (1,391,741) | 1,795,936 |
| දායක හා සාමාජික මුදල් | 5,000 | - | 5,000 | - |
| විභාග ගාස්තු | 3,100,000 | 3,636,106 | (536,106) | 1,955,679 |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ | 1,900,000 | 2,131,994 | (231,994) | 1,058,432 |
| පර්යේපණ සඳහා පහසුකම් සැලසීමේ අරමුදල | 1,400,000 | 1,185,050 | 214,950 | |
| සංයුක්ත සැලසුම් | 200,000 | 150,000 | 50,000 | |
| මුද්දර ගාස්තු | 50,000 | 13,875 | 36,125 | 20,350 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 100,000 | 133,370 | (33,370) | 171,143 |
| එකතුව | **18,290,000** | **19,137,868** | **(847,868)** | **9,982,804** |

## 14. විගණන කමිටු වාර්තාව -2013

### විගණන කමිටුවේ සංයුතිය

කළමනාකරණ මණ්ඩලයට වගකිව යුතු එහි උප කමිටුවක් වශයෙන් විගණණ කමිටුව ස්ථාපනය කොට ඇති අතර, එය විධායක නොවන කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් හා කළමනාකරණ මණ්ඩලයේ අභ්‍යන්තර සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

ඒ අනුව එකී විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය.

| සාමාජිකයාගේ නම | සහභාගි වූ වාර ගණන |
|---|---|
| ආචාර්ය අමර සතරසිංහ - සභාපති (අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව) | 03/04 |
| ඩබ්. ඩී.එල්. ගුණරත්න - සාමාජික ( අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) | 04/04 |
| ආචාර්ය ඩී. බී. ටී. විජේරත්න - සාමාජික (අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යංශය | 01/04 |
| මහාචාර්ය කේ. සමරසිංහ - සාමාජික (පීඨාධිපති, කෘෂිකර්ම පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 02/04 |

ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් සහ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂතුමාද නිරීක්ෂකයින් වශයෙන් කැඳවනු ලැබේ.

### රැස්වීම්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 31 අනුව මෙම කමිටුව අවම වශයෙන් වසරකට හතර වතාවක් රැස්විය යුතුය. එකී රැස්වීම්වලදී අභ්‍යන්තර හා රජයේ විගණන නිලධාරින් විසින් දෙන ලද විගණන වාර්තා සාකච්ඡාවට භාජනය කරන ලදී. ඒ අනුව ආයතනයේ පාලක මණ්ඩලයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හා පියවර ගැනීමට එකී කමිටු රැස්වීම්වල වාර්තා ලබා දෙනු ලැබේ.

### ප්‍රධාන වගකීම්

ආයතනයේ මූල්‍ය හා එයට අදාළ අනෙකුත් කටයුතු හා බැඳුනු වගකීම් සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට සහය වීම මෙම විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේය.

විගණන කමිටුවට පැවරී ඇති එම වගකීම් පහත දැක්වේ .

a) මූල්‍ය ප්‍රකාශ, මූල්‍ය වාර්තාකරණය හා විගණන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා මෙහෙයුම් කටයුතු .
b) ආයතනයේ මූල්‍ය හා ඒ සම්බන්ධ අනෙකුත් කටයුතුවලට සම්බන්ධ ඕනෑම කරුණක් සම්බන්ධව පරීක්ෂණ කිරීම.
c) අභ්‍යන්තර විගණන සැලසුම් හා වැඩසටහන් සම්බන්ධ මෙහෙයුම් කටයුතු
d) අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කිරීම හා ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම. එසේම එකී වාර්තාවලින් දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක වන්නේදැයි පසු විපරම් කිරීම
e) අභ්‍යන්තර පාලන තන්ත්‍රය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේදැයි සමාලෝචනය කිරීම හා මෙහෙයවීම.
f) වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් හා වැඩසටහන් අනුමත කිරීම.

4 අදාළ වර්ෂය තුළ විගණන කමිටුවේ අධීක්ෂණයට ලක් වූ ක්‍රියාකාරකම්.

**(ආ) විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ විගණන කමිටුව පහත සඳහන් කාර්යයන් සිදු කොට ඇත .**

- දී ඇති උපදෙස් අනුව ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර අවසන් කරන තුරු එම කාර්යයට අවශ්‍ය උපදෙස් දෙමින් නිරන්තර මෙහෙයුම් කටයුතු සිදු කිරීම.
- ගිණුම් කටයුතු සම්බන්ධ යම් වැරදි තිබුණහොත් අදාළ වර්ෂය තුළම එම වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා, එම වැරදි නැවත ඇති නොවීම සහතික කර ගනු පිණිස ගිණුම් අංශයේ කටයුතු නිරන්තර මෙහෙයුමකට ලක් කිරීම.
- 2013 වසරට අදාළවාර්ෂික තහවුරු කර ගැනීම් නියම වේලාවට සිදුවන්නේදැයි අධීක්ෂණය කිරීම.
- විගණන කමිටුවේ කාර්යයන් සරල හා කාර්යක්ෂම තත්වයට පත්කිරීම හා විගණන විමසුම් වලට පිලිතුරු දීම.
- රාජ්‍ය ව්‍යාපාර පිලිබඳ කාරක සභාව (COPE) නිර්දේශ අනුගමනය කරන්නේ දැයි අධීක්ෂණය කිරීම.
- 2013 -2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීම හා 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- ආයතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපෘති කටයුතු කරගෙන යාමේදී භාවිත කරනු ලබන ක්‍රම, අදාළ නීති රෙගුලාසි චක්‍රලේඛවලට හා අදාල වාර්තාවලට අනුකූලව සිදුවන්නේදැයි තහවුරු කරගැනීමට අදාළ මෙහෙයුම් කටයුතු සිදු කිරීම හා, ඒ සම්බන්ධව කළමනාකරණ මණ්ඩලය දැනුවත් කිරීම.

### (ආ) අභ්‍යන්තර විගණන සැලසුම හා වැඩසටහන අනුමත කිරීම හා මෙහෙයවීම

පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ විගණන කටයුතු පවරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණන නිලධාරියා විසින් 2013 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වැඩසටහන සඳහා විගණන කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී.

ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද කාර්තුමය ප්‍රගතිය විගණන කමිටුව විසින් අනුමැතිය දෙන ලද විගණන සැලසුමේ, සඳහන් කොට ඇති විගණන සැලසුම්වලට අනුව සිදු වී ඇතිදැයි පවත්වන ලද රැස්වීම් හතරේදී සමාලෝචනයට භාජනය කරන ලදී . මෙම කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායී බව සහ අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු පරීක්ෂණයට භාජනය කරන ලද අතර, ආයතනයේ මූල්‍ය පාලනය හා සම්බන්ධව පවත්නා තත්වය වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදු කරන ලදී.

### (ඇ) නීති හා රෙගුලාසිවලට දක්වන අනුකූලත්වය

අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සහ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ පවත්නා නීති හා රෙගුලාසිවලට අනුකූල වන්නේදැයි විගණන කමිටුව විමර්ශනයට භාජනය කරන ලදී. අදාළ වර්ෂයේ අවසාන කාලයේදී ආයතනය රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයකට අනුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කරන ලදී .

මෙම ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය රැස්වීම් දෙකක් පැවැත්වූ අතර, එහිදී ආයතනයේ කටයුතු වඩා විධිමත් හා සරල ක්‍රියාවලියක් බවට පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

විගණන විමසුම් සඳහා උත්තර සැපයීමේ ක්‍රියාවලිය විගණන කමිටුව විසින් අඛණ්ඩව විමර්ශනය කරන ලද අතර, විගණකාධිපති විසින් කරන ලද විගණන විමසුම් සඳහා නියමිත අවශ්‍ය පිළිතුරු ලබා දෙන ලෙස උපදෙස් දී ඇත . විගණකාධිපති විසින් මතුකරන ලද එකී විගණන ගැටළු සඳහා දෙන ලද පිළිතුරු පිළිබඳ විගණන කමිටුව සෑහීමට පත් වී ඇති අතර ආයතනික පරිපාලන ක්‍රියාවලියේ දක්නට ලැබෙන අඩුපාඩු හා ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා එකී කමිටුව රජයේ විගණකවරුන් සමග ප්‍රයෝජනවත් සාකච්ඡා පවත්වන ලදී . ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ එම සාකච්ඡාවල සතුටුදායක ප්‍රතිඵල අත්පත් කර ගැනීමට ආයතනයට හැකි විය.

### (ඉ) අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ශක්තිමත් කිරීම

මෙම විගණන කමිටුව ආයතනයේ වාර්තාකරණ ක්‍රියාවලියේ හා වාහන පාලනය, කොන්ත්‍රාත් කටයුතු පරිපාලනය, අතිකාල ගෙවීම් පාලනය කිරීම, මූලධන වත්කම් මිලදී ගැනීම, වාර්ෂික ගබඩා කටයුතු , සමීක්ෂණ කටයුතු , තොග වට්ටෝරු පොත් පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම, පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම, ශිෂ්‍යයන් විසින් නොගෙවන ලද ගාස්තු අයකර ගැනීම, ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම, ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් සකස්කිරීමට අදාළ ගැටලු නිරාකරණය යනාදී කටයුතුවල කාර්යක්ෂමතාව විමර්ශණය කරන ලද අතර, ඒ දක්වා නොවිසඳී තිබූ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම කරන ලදී. එසේම අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කරලීමට අවශ්‍ය නිර්දේශ ද එකී විගණන කමිටුව විසින් දෙනු ලැබ ඇත .

(ඊ) විගණන කමිටු රැස්වීම්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත මෙම සෑම විගණන කමිටු රැස්වීමකටම ආරාධනා මත රජයේ විගණන අධිකාරී සහ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ නිරීක්ෂණයෝ වශයෙන් සහභාගී වූහ.මීට අමතරව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති එකී විගණන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලදී.

## 05. නිගමනය

අදාළ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් දෙන ලද උපදෙස්වලට අනුව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම හා ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පතක් සකස් කිරීම සම්බන්ධයෙන් පාලනාධිකාරිය විසින් ගන්නා ලද ප්‍රාරම්භයන්ගේ (initiatives) ප්‍රගතිය පිළිබඳ එම කමිටුව සෑහීමකට පත්ව ඇත . මෙහි ප්‍රථිඵලයක් ලෙස කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය විසින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ අවසාන ගිණුම් සම්බන්ධව පැහැදිලි අදහසක් ලබා ගනිමින් සිටින බව එකී විගණන කමිටුව පෙන්වා දෙන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීඑල්1/කේඩී/ජේ/පීජීඅයිඒ/ 1/13/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2014 දෙසැම්බර් ‥ දින | | |

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :
1. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්1/කේඩී/ජේ/පීජීඅයිජ්/ 1/13/10    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 11 දින

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :
1. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } පීඑල්/1/කේඩී/ජේ/පීජීඅයිජ්/1/13/10 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 11 දින.

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අංක 68/11 සහ 1979 දෙසැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2014 ජූනි 03 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94 11 2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාර තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන නමුත් ක්ෂය කිරීමෙන් ශුන්‍ය අගයට පත්ව ඇති රු.81,659,309 ක් ගත් මිල වූ වත්කම් අයිතම 08 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2013 වර්ෂයේදී කාර්ය පැවරුම් පදනම මත බඳවා ගත් රියදුරෙකුට ගෙවන ලද එකතුව රු.255,642 ක් වූ වාර්ෂික වැටුප, වැටුප් හා වේතන වැය විෂයය යටතේ නොදක්වා විශේෂ සේවා වැඩසටහන යටතේ දක්වා තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 204,367,725 ක් වූ පහත දැක්වෙන ගිණුම් විෂයයන් 13 හි ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 73,738,756 | සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ස්ථාවර වත්කම් ලේඛණ |
| ලී බඩු සහ සවිකිරීම් | 1,655,035 | - එම - |
| කාර්යාල උපකරණ | 11,163,827 | - එම - |
| මෝටර් රථ | 14,495,000 | - එම - |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 34,001,492 | - එම - |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 44,488,869 | - එම - |
| දුරකථන | 34,915 | - එම - |
| නිවාස ව්‍යාපෘතියේ උපකරණ | 490,749 | - එම - |
| රැඳවුම් මුදල් | 711,654 | ශේෂ තහවුරු ලිපි |
| වෙනත් තැන්පතු | 157,800 | - එම - |
| ඉදිරියට ගෙවූ ලියාපදිංචි සහ අනෙකුත් ගාස්තු | 481,911 | - එම - |
| ඉදිරියට ගෙවූ පාඨමාලා ගාස්තු ආදායම් | 20,349,767 | - එම - |
| ඉදිරියට ලැබූ ආදායම් | 2,597,950 | - එම - |
| එකතුව | 204,367,725 | |

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | ආයතනයක අතිරේක මුදල් අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව ආයෝජනය කළහැකි වුවත්, සමාලෝචිත වර්ෂය තුළ රු.121,000,000 ක මුදලක් අදාල අනුමැතින් නොලබා ආයෝජනය කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| (i) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.7 හා 3.8 ඡේද | ණය මුදලක් දුන් පසු ඊළඟ මාසයේ සිටම ණය වාරික මාසිකව අයකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 27 දෙනෙකුට දෙන ලද ණය මුදල් සඳහා අප්‍රේල් හා දෙසැම්බර් මාසවල එකතුව රු.214,535 ක්වූ ණය වාරික අයකර නොතිබුණි. |
| (ii) XIV වැනි පරිච්ඡේදයේ 28.5 සහ 28.6 ඡේද | ගමන අවසන් කර දින 30 ක් ඇතුළත ගමන් වියදම් ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ නිලධාරීන්ගෙන් අයකළයුතු එකතුව රු.58,523 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(4) | ගණන්දීමේ නිලධාරියා විසින්ම වුවද ප්‍රයෝජනයට ගැනීම අනිසිවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම නොගත යුතු වුවත්, අවස්ථා 03 කදී ලබා ගන්නා ලද රු. 60,000 ක අත්තිකාරම් මුදලින් සියයට 39 ක් හෙවත් රු.23,488 ක් අදාළ කාර්යයට යොදා නොගෙන ආපසු පියවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751 | ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛණ පොතෙහි ඇතුළත් කළයුතු වුවත්, නියැදි පරීක්ෂාවන්ට අනුව රු. 41,000 ක භාණ්ඩ ලැබීම් තොග පොත්වල ඇතුළත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය / විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXVII වැනි පරිච්ඡේදයේ 08 වන ඡේදය | මාස 06 කට වරක් සෑම වාහනයකම ඉන්ධන දහනය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් ප්‍රවීණ ඉංජිනේරුවරයකු ලවා කළ යුතු නමුත්, ආයතනය සතු වාහන 04 ක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

| | | |
|---|---|---|
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර සඳහා වෙනම ලේඛනයක් චක්‍රලේඛය ප්‍රකාරව නඩත්තු කර නොතිබුණි. |
| (ඊ) | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ උපරිම දුරකථන වියදම් සීමාව ඉක්මවා වියදම් ප්‍රතිපූර්ණ කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.42,097 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණු අතර, අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පෞද්ගලික සහකාරවරියකගේ දුරකථන වියදම් රු.24,219 ක්ද ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (උ) | 1994 ජුනි 14 දිනැති අංක 95(02) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2003 ජනවාරි 29 දිනැති අංක PE1/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අවසරයක් නොමැතිව ගාස්තු, දිරිදීමනා, දීමනා ගෙවිය නොහැකි වුවද, කෙටිකාලීන පාඨමාලා සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා දීමනා හා වාර්ෂික සම්මේලනය සඳහා සම්බන්ධීකරණ දීමනා ලෙස එකතුව රු.120,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඌ) | 2003 මැයි 29 දිනැති අංක UGC/HR/6/1/13(1) හා 2003 දෙසැම්බර් 29 දිනැති අංක 837 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව, අනුමත සීමාව ඉක්මවා කෙටිකාලීන පාඨමාලා සඳහා දේශන ගාස්තු සහ ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු රු.253,850 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (එ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධාරීන් සඳහා මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය 140 ක් වුවද, අධ්‍යක්ෂකවරයාට එම සීමාව 170 ක් ලෙස සලකා චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කිරීම හේතුවෙන් 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 58,212 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. |

(ඒ) 2011 මාර්තු 07 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අංක IRD/PAYE/REG/01 - 2011 අයවැය යෝජනා අනුව දේශීය ආදායම් පනතේ සංශෝධනයේ බදු චක්‍ර අංක 07 සහ 01 අවස්ථා 30 කට අදාල රු.125,523 ක් වූ උපයනවිට ගෙවීම් බදු අඩු කර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා හා වැටුප් වර්ධකයන් ගෙවිය හැක්කේ, රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා පමණක් බව රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑප්/1/174/11 හා 1996 මාර්තු 06 දිනැති ලිපිය මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත දැනුම් දී තිබියදී, ඊට අනුකූල නොවන පරිදි 1996 වර්ෂයේ සිට 2013 මැයි මස දක්වා එකතුව රු. 1,307,794 ක්වූ භාෂා ප්‍රවීණතා දීමනා ගෙවීම් කොට තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED 58(2) හා 2011 සැප්තැම්බර් 15 දිනැති චක්‍රලේඛයේ 02 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූල නොවන ලෙස ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ ලේකම්වරුන් වෙත සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂය වෙනුවෙන් රු.162,500 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ IX පරිච්ඡේදය ප්‍රකාර තොග සමීක්ෂණ කටයුතු, රාජකාරී වේලාවෙන් බැහැරව සිදුකරනවා නම් අතිකාල හෝ නිවාඩු දින වැටුප් ගෙවිය හැකි වුවත්, එයට අනුකූල නොවන ලෙස 2012 වර්ෂය සඳහා නිලධාරීන් 05 දෙනෙකුට හා 2013 වර්ෂය සඳහා නිලධාරීන් 06 දෙනෙකුට එකතුව රු. 127,303 ක ගෞරව දීමනා ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය රු. 34,250,532 ක් වී තිබූ අතර, ඉකුත් වර්ෂයේ එය රු. 21,271,268 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,979,264 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සීමාතරණය කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.67,192,332 ක මුදලක් නෙදර්ලන්තයේ වර්ජිනින්ජන් විශ්වවිද්‍යාලය විසින් ආයතනය වෙත ලබා දී තිබූ අතර, එයින් රු. 111,677 ක මුදලක් වියදම් නොකර ඉතිරි වී තිබුණි. විගණන දිනය වූ 2014 මාර්තු 31 දින වන විටත් මෙම මුදල ආපසු පියවීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 1,214,716 ක් වූ පර්යේෂණ අරමුදල් ශේෂ 03 ක් වර්ෂ 01 ත් 04 ක් අතර කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) ජාතික විද්‍යා පදනම මඟින් කම්පන හා වායු පායනය සහිත බහු පියවර තේ සහ පොල් වියලනයක් නිර්මාණය හා සංවර්ධනය නමැති ව්‍යාපෘතිය සඳහා 2013 අප්‍රේල් මාසයේදී ලබා දී තිබූ රු. 1,108,090 ක මුදලින් සියයට 76 ක්වූ රු.840,822 ක මුදලක් වියදම් නොකර ඉතිරි වී තිබුණි.

4.3 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

2010/12 වර්ෂවලට අයත් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා මුද්‍රණය කර තිබූ රු. 88,200 ක වටිනාකමින් යුතු පාඨමාලා අත්පොත් 180 ක් අලෙවි නොවන තොගයක් ලෙස හඳුනා ගෙන තිබුණි.

4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1975 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, ආයතනය පිහිටි ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට 2014 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට නීත්‍යානුකූලව පවරා නොගත් ඉඩම්වල රු.73,738,756 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක PED/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය පරිදි මානව සම්පත් අයවැය ලේඛණයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 දෙසැම්බර් 31 දිනැති අංක 26/2010 දරන චක්‍රලේඛය ප්‍රකාරව, මහාභාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී තනතුරු 03 ක් සඳහා නිලධාරීන් / සේවකයින් තිදෙනෙකු බඳවා ගෙන රු. 677,431 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2013 වර්ෂයේ සංයුක්ත සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය 2013 ජූලි 26 දින ලබාගෙන තිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටු කර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, ඒ සඳහා 2013 මාර්තු 22 වන දින කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජූනි 09 දිනැති "අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ" යන මැයෙන් යුතු කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) හි 07 ඡේදය පරිදි මුදල් රෙගුලාසි 133 හා 134 කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආයතනයේ අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කළ යුතු වුවද, සියළුම අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර නොතිබුණු අතර, ආයතනයේ ක්‍රියාත්මක වන කළමනාකරණ හා මූල්‍ය පරිසරයේ වෙනස්වීම්වලට ද අනුකූල වන පරිදි මෙම වැඩසටහන් වාර්ෂිකව සංවර්ධනය කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 09 වගන්තිය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කළයුතු අතර, එය කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කර වාර්ෂිකව පිළියෙල කළයුතු වාර්තාවන් ඉදිරිපත් කළයුතු නමුත්, එම වාර්තා අදාළ අංශ වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජූනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2.5 ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මට අනුව, දීර්ඝ කාලීන පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස සහ වර්ෂය ආරම්භයේදී අරමුණු ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා අධ්‍යක්ෂකවරයා වෙත වරින් වර මාගේ වාර්තා මඟින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) පර්යේෂණ හා ප්‍රදානයන්

(ආ) ගිණුම්කරණය

(ඇ) ලේඛන පවත්වාගෙන යාම

(ඈ) තොග පාලනය

(ඉ) සේවක ණය පරිපාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය
# POSTGRADUATE INSTITUTE OF AGRICULTURE, PERADENYA
## Audit Replies - විගණන පිළිතුරු වාර්තාව

දිනය:2015.04.23

විමසීම් අංකය : සිඑල්/කේඩී/ජේ/ පීජීඅයිඒ/බීඩී/1/13/10
ලිපි යොමුව : සහකාර විගණකාධිපති, රජයේ විගණන අංශය වෙතටයි
විෂයය : විගණකාධිපති වාර්තාව - 2013

ඔබ විසින් මා වෙත යොමු කරන ලද උක්ත අංක දරන හා 2014.12.11 දිනැති විගණකාධිපති වාර්තාවට අදාල හේතු පැහැදිලි කිරීම් පහත දැක්වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විටත් සකස් කර ඇති අතර ක්ෂය අඩුකල පසු අගය ශුන්‍ය වී ඇති ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය ලබා ගැනීමට 2014 අගෝස්තු මස 1 දින පැවති 45 වන විගණන කමිටු රැස්වීමේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් 2014.12.02 දිනැති ලිපිය මගින් පලාත් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කල අතර එම කටයුතු සඳහා අවශ්‍ය වත්කම් ලේඛණ එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කොට ඇත.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

2013 වර්ෂයේ කාර්ය පැවරුම් පදනම මත බඳවාගත් රියදුරු බඳවා ගැනීමට අදාලව අනුමත කාර්ය මණ්ඩල ප්‍රතිපාදන (Cadre) නොතිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදන විශේෂ සේවා වැඩ සටහන යටතේ වෙන් කර එම වැය ශීර්ෂය යටතේ ගෙවීම් කටයුතු සිදුකර ඇත.

2.2.3. විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

| විෂයය | වටිනාකම | හේතු පැහැදිලි කිරීම් |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 73,738,756 | ආයතනය සතුව ස්ථාවර වත්කම් ලේඛනයක් සමාලෝචිත වර්ෂය දක්වා නොතිබුණු අතර ආයතනය විසින් නඩත්තු කරන ලද ඉන්වෙන්ට්‍රි ලේඛන සහ භෞතිකව සිදුකරන ලද සත්‍යාපන තොරතුරු පදනම් කරගෙන 2012.12.31 දිනට පිලියෙල කල ස්ථාවර වත්කම් ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි. තවද 2013.12.30 දින පැවති විගණන කමිටුවේ නිර්දේශය අනුව සංශෝධනය කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය 2013 අවසන් ගිණුම් සමග විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි. එසේම 2014 අගෝස්තු 01 වන දින පැවති විගණන කමිටුවෙන් ලබාදුන් උපදෙස් පරිදි ක්ෂය ප්‍රතිපාදනය අවසන් වූ ස්ථාවර වත්කම් |

| | | |
|---|---|---|
| | | ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටුකර ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අනුව වත්කම් ප්‍රත්‍යාගනණය කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කොට ඇත. ඒ අනුව ප්‍රත්‍යාගණන වටිනාකම්ද සැලකිල්ලට ගෙන සකස් කරනු ලබන අවසන් ස්ථාවර වත්කම් ලේඛනය 2014 වර්ෂයේ අවසන් ගිණුම් සමග විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| ලී බඩු හා සවිකිරීම් | 1,655,035 | -එම- |
| මෝටර් රථ | 14,495,000 | -එම- |
| කාර්යාල උපකරණ | 11,163,827 | -එම- |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 44,488,869 | -එම- |
| දුරකථන | 34,915 | -එම- |
| නිවාස ව්‍යාපෘතියේ උපකරණ | 490,749 | -එම- |
| පුස්තකාල පොත් හා වාර | 34,001,492 | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව පත් කරන ලද බාහිර පුද්ගලයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් මෙම සමීක්ෂණය 2014 ජූලි මස 24 දින සිට අගෝස්තු මස 11 වන දින දක්වා සිදුකරන ලදි. සමීක්ෂණ මණ්ඩලයේ මූලික වාර්තාව ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2014 නොවැම්බර් 15 දින ලබා දුන් අතර භෞතිකව සත්‍යාපනය කල තොගය සහ පොත්වල පෙන්වන වටිනාකම් අතර වෙනසට හේතු පැහැදිලි කිරීම් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියගෙන් ලබා ගෙන ඇත. මෙහි අවසන් වාර්තාව ලද විගස අදාල ආයතන වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| වෙනත් තැන්පතු | 157,800 | ශේෂ තහවුරු කිරීමේ ලිපි 2013.12.31 දිනට යවා තිබුණි |
| ටෙන්ඩර් තැන්පතු | 44,492 | ශේෂ තහවුරු කිරීමේ ලිපි අදාල ආයතන වලට යැවීමට මේ වන විටත් කටයුතු කර ඇත. |
| රැඳවුම් තැන්පතු | 657,834 | -එම- |
| ඉදිරියට ගෙවූ ලියාපදිංචි හා අනෙකුත් ගාස්තු ආදායම් | 481,911 | ශේෂ තහවුරු කිරීමේ ලිපි මේ වන විටත් සකස් කරමින් පවතින අතර අදාල තහවුරු |

කිරීම් ලද විගස විගණනය සඳහා ඉදිරිපත් කරමි.

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙවූ පාඨමාලා ගාස්තු ආදායම් | 20,349,767 | -එම- |
| ඉදිරියට ලැබූ ආදායම් | 2,597,950 | -එම- |

**2.3. නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

(අ) **1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය**

සිසුන්ගෙන් ලද පාඨමාලා ගාස්තු හා විවිධ ආයතන වලින් පර්යේෂණ කටයුතු සඳහා ලද අරමුදල් වල තාවකාලික අතිරික්තයන්, කෙටි කාලීන ස්ථාවර තැන්පතු හා නිවේදන තැන්පතු වශයෙන් 2008.03.03 දිනැති හා අංක ටීඕ/ඩීසිඑෆ්/30 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය බැංකු වල පමණක් මුදල් කමිටුවේ නිර්දේශය හා කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත ආයෝජනය කිරීමට කටයුතු කර ඇත.

එමෙන්ම 2014.09.26 දින පැවති 27 වන මූල්‍ය කමිටුවේ නිර්දේශය මත හා 2014.11.28 දින පැවති 210 දරන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත තාවකාලික ආයෝජන සිදු කිරීමේ අධිකාරි බලය කළමනාකරණ මණ්ඩලය වෙත පැවරීම සඳහා 2014.12.05 දිනැති ලිපිය මගින් අනුමැතිය ඉල්ලා ඇති බව දන්වා සිටිමි.

(ආ) i. **ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.7 හා 3.8 ඡේද**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරන ලද අංක 88 හා 1978.03.02 දිනැති සැපයීම් හා මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මාර්තු හා දෙසැම්බර් මාසයන්හිදී මාසික වැටුපෙන් ණය වාරික අඩුකර ගනු නොලබන අතර අදාල මාස සඳහා පොලී මුදල් පමණක් අඩුකරගනු ලැබේ .එසේම ඉහත සඳහන් අනුග්‍රහයන් අපේක්ෂා නොකරන ලද සේවකයින්ගේ ණය වාරික මුදල් අදාල පොලී මුදල්ද සමග මෙම මාස සඳහාද අඩුකර ගැනීමට කටයුතු කර ඇත.

ii. **XIV වැනි පරිච්ඡේදයේ 28.5 හා 28.6 ඡේද**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බාහිර දේශන පැවැත්වීමේදි අදාල විෂයයන් වල දේශන අවසන් කර විභාග පවත්වා ලකුණු නිකුත් කල පසු පමණක් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව ගමන් වියදම් ප්‍රතිපූරණය කර ගැනිමේදි සලකා බලනු ලබන්නේ ගමන අවසන් කල දිනය නොව ඉහත දැක්වූ කොන්දේසි සපුරා ගෙවීම් කටයුතු සඳහා ඉල්ලුම් කල දිනයයි. එසේ වුවත් 2014 මැයි මස 30 දින පැවැත්වූ සම්බන්ධීකරණ කමිටු රුස්වීමට ඉදිරිපත් කර ඉහත දැක්වූ කොන්දේසි ඉවත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ඉදිරියේදි ගමන් වියදම් ප්‍රතිපූරණය කිරීමේදි අදාල ගමන අවසන් කල දිනය පදනම්ව ප්‍රමාද ගාස්තු අය කර ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ). i. **මුදල් රෙගුලාසි 371(4)**

විගණන වාර්තා කෙටුම්පතේ සඳහන් කර ඇති පරිදි අවස්ථා 3 කදී ඉදිරිපත් කරන ලද අයවැය ඇස්තමේන්තු සැලකිල්ලට ගෙන රු. 20,000.00 බැගින් අත්තිකාරම් මුදල් නිදහස් කලද අත්තිකාරම් පියවීමේදී අපේක්ෂිත පරිදි වියදම් දැරීමක් සිදුවී නොමැති බව පිලිගන්නා අතර ඉදිරියේදී අත්තිකාරම් මුදල් ලබාදීමේදී මේ පිලිබඳව වගකිවයුතු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරමි.

ii. **මුදල් රෙගුලාසි 751**

2013.03.14 දින ප්‍රධාන ගබඩාවට ලැබුණු රු. 41,000.00 ක් වටිනා ටෝනර් 4 ක වටිනාකම අත් වැරදීමකින් තොග පොතේ සටහන් නොවූවද භාණ්ඩ ලැබීම් පත්‍ර 11497 යටතේ ප්‍රධාන ගබඩාවේ ලැබීමක් ලෙස සටහන් කර ඇති අතර නිකුතු අංක 19 හා 192 මගින් ජායා පිටපත් අංශයට නිකුත් කර තිබුණි. එබැවින් එම මග හැරීම මගින් අවසාන තොගයට බලපෑමක් නොවුනු අතර පසුව සටහනක් මගින් අදාල ලැබීම හා නිකුත් කිරීම පොත්වල සටහන් කිරීමට කටයුතු කර ඇත.

(ඈ) **1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

2013.12.31 දිනැති හා අංක 40 දරන විගණන කමිටුවේදී ගත් තීරණයකට අනුව ප්‍රවීණ ඉංජිනේරුවෙකු ලවා ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමේ දුෂ්කරතාවය සැලකිල්ලට ගෙන එය ආයතනයේ විධායක නිලධාරීන් තිදෙනෙකුගේ අධීක්ෂණයෙන් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2013 වර්ෂයේ අවස්ථා දෙකකදී ධාවන තත්වයේ පැවැති වාහන අතරින් අධ්‍යක්ෂතුමාගේ නිල වාහනය හැර අනෙක් වාහන තුනට අදාලව උක්ත පරීක්ෂාව සිදු කොට ඒ අනුව ධාවන සටහන් තුලනය කර පවත්වාගෙන යනු ලබයි.

(ඉ) **2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය**

විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි හා භාණ්ඩාගාර චක්‍රලේඛයේ උපදෙස් අනුව පරිඝණක සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කොට ඇත.

(ඊ) **2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

රාජ්‍ය සේවකයන් හා රාජ්‍ය ආයතන සඳහා සන්නිවේදන පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2010.09.01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ආදේශ කර ගැනීමේදී එහි අංක VI කාණ්ඩය යටතේ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 922 හි සඳහන් මධ්‍යම හා පහළ ශ්‍රේණි වලට අයත් විධායක නිලධාරීන්ට රු. 4,000.00 ක සීමාවට යටත්ව සන්නිවේදන වියදම් ප්‍රතිපූරණය කල හැකි බව දක්වා ඇත. ඒ අනුව කොමිෂන් සභා

චක්‍රලේඛ අංක 922 ට අනුව පහළ විධායක ශ්‍රේණියට අයත් පෞද්ගලික ලේකම් තනතුර සඳහා රු. 4,000.00 ක සීමාවකට යටත්ව දුරකථන වියදම් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර ඇත. එසේම මෙම දීමනා ගෙවීම 2012 අංක 21 දරන මූල්‍ය කමිටුවේ නිර්දේශය හා 2012.11.12 දිනැති අංක 197.5 දරන කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත සිදුකර ඇත.

(උ) 1994 ජූනි 14 දිනැති අංක 95(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2003 ජනවාරි 29 දිනැති අංක PE1/174 11 - 2003 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය

ඩී. ඒ. එන් ධර්මසේන, රු. 75,000.00

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2013.05.05. දින සිට 2013.05.11 දින දක්වා නේපාල රජයේ පරිපාලන නිලධාරින් 11 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු කරන ලද ජාත්‍යන්තර වැඩ මුළුව සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් අංක 23.5 හා 2013.06.20 දිනැති මුදල් කමිටුවේ නිර්දේශය හා අංක 202 හා 2013.09.27 දිනැති කළමණාකරණ මණ්ඩල රුස්වීමේ අනුමැතිය මත මෙම දීමනාව ගෙවා ඇත. එසේම අදාල වැඩමුළුව සම්බන්ධයෙන් වන ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමේ සිට වැඩමුළුවේ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් මෙම ගෙවීම සිදු කර ඇත.

බී. එල්. පීරිස් - රු. 10,000.00

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2013..09.04. දින සිට 2013.09.06 දින දක්වා සාමාජිකයින් 130 කගේ සහභාගිත්වයෙන් පැවති කෙටිකාලීන වැඩ මුළුවේ සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් 2013.06.20 දින පැවති 23 වන මූල්‍ය කමිටුවේ නිර්දේශය මත හා 2013.09.27 දින පැවති 202 වැනි කළමණාකරණ මණ්ඩල රුස්වීමේ අනුමැතිය පරිදි මෙම දීමනාව ගෙවා ඇත.

ආර්. එම් ෆොන්සේකා, රු. 35,000.00

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත සේවක ප්‍රතිපාදන වලට ඇතුලත් තනතුරක් වන වාර්ෂික සමුළුවේ සම්බන්ධීකාරක වෙනුවෙන් 2013.09.05 දින පැවති 23 වන මූල්‍ය කමිටුවේ නිර්දේශය මත හා 2013.09.27 දින පැවති 202 වැනි කළමණාකරණ මණ්ඩල රුස්වීමේ අනුමැතිය පරිදි මෙම ගෙවීම සිදුකර ඇත.

(ඌ) 2003 මැයි 29 දිනැති අංක UGC/HR/6/1/13(I&) හා 2003 දෙසැම්බර් 29 දිනැති අංක 837 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය

2013 මැයි මස 29 දිනැති අංක UGC/HR/6/1/13(i) හා 2003 පෙබරවාරි 29 දිනැති අංක 837 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ මගින් පශ්චාත් උපාධි පාඨමාලා වලට අදාල දේශන හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් බාහිර දේශකවරුන්ට ගෙවීමට අදාල ප්‍රතිපාදන සලසා ඇත. එහෙත් විගණන කෙටුම්පත් වාර්තාවෙන් පෙන්වා දී ඇත්තේ ආයතනය මගින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර වැඩමුළුවක හා කෙටිකාලීන වැඩමුළුවක දේශන හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම

වෙනුවෙන් කරන ලද ගෙවීමකි. එබැවින් උක්ත චක්‍රලේඛයේ විධිවිධාන මෙම ගෙවීම සම්බන්ධයෙන් අදාල නොවන බව දන්වා සිටිමි.

එසේම විගණන වාර්තාවේ සඳහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය, 2014.02.10 දිනැති අංක UGC /HR/6/1/13(I) දරන නව චක්‍රලේඛය මගින් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර එමගින් විගණන වාර්තාවේ සඳහන් දේශන ගාස්තු සඳහා වන උපරිම සීමාව ඉවත් කිරීමට කටයුතු කර ඇත.

කෙසේ වෙතත් මෙම වැඩමුළු සඳහා සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු මුදල් කමිටුවේ නිර්දේශය මත කලමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එහිදී මෙම දේශන හා ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා සූදානම් වීමට වැයවන කාලය හා විශේෂඥ දැනුම සැලකිල්ලට ගෙන සාමාන්‍ය දේශන හා ප්‍රායෝගික ගාස්තු වලට වඩා වැඩි ගෙවීමක් කිරීමට අනුමත කර ඇත.

(ඵ) **2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ලේකම්ගේ අංක 13/2008(iv) හා 2011.02.09 දිනැති චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 2/2011 හා 2011.03.10 දිනැති මුදල් චක්‍රලේඛය මගින් ආදේශ කර ගැනීමේදී විශ්වවිද්‍යාල වල අනුයුක්ත කල නිලවාහන හිමි නිලධාරීන් නිශ්චිතව වර්ගීකරණයක් සිදුකර නොමැත. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වාචිකව විමසීමේදී අනාවරණය වූයේ ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් හට මාසික ඉන්ධන සීමාව ලීටර් 170 ක් සේ සලකා ගෙවීම් කටයුතු කරනු ලබන බවයි. එසේම ඉන්ධන දීමනාව ගෙවීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව කොමිෂන් සභාවේ ලේකම් හා ආයතන අධ්‍යක්ෂ වරුන් සඳහා සමාන ඉන්ධන දීමනාවක් ගෙවා ඇත. ඒ අනුව ආයතනයේ අධ්‍යක්ෂවරයා හටද මාසික ඉන්ධන දීමනාව ලීටර් 170 ක් සේ සලකා ගෙවීම් කටයුතු කර ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් පැහැදිලි කර ගැනීම සඳහා 2013 නොවැම්බර් මස 06 දිනැති ලිපිය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීමක් සිදු කර ඇත.

(ඒ) **2011 මාර්තු 07 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්ගේ අංක IRD/PAYEE/REG/01 – 2011 අයවැය යෝජනා අනුව දේශීය ආදායම් පනතේ සංශෝධනයේ බදු චක්‍ර අංක 07 සහ 01**

විගණන වාර්තාවේ සඳහන් කර ඇති උපයන විට බදු අඩුකර නොමැති බව දක්වා ඇති ලේඛණයේ පහත සඳහන් වවුචර්පත් වලින් අදාල බදු මුදල් අඩු කර ඇති බව දන්වා සිටිමි.

| වවුචර් අංක | නම | ගෙවූ මුදල | අඩුකල බද්ද |
|---|---|---|---|
| 269 | එච්.එම්.වී.ජී. හේරත් | 13,500.00 | 1,350.00 |
| 289 | එච්.ඩබ්. සිරිල් | 22,050.00 | 2,205.00 |

විගණන වාර්තාවේ දක්වා ඇති අනෙකුත් ගෙවීම්වලට අදාල බාහිර දේශකවරුන් සේවායෝජකයන් එක් අයෙකුට වඩා වැඩි ප්‍රමාණයක් විසින් සේවයේ යොදවා ඇති පුද්ගලයින් නොවන බැවින් (දැනටමත් විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ගොස් ඇති) දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්ගේ 2011 මාර්තු 07 දිනැති අංක IRD/PAYE/REG/01 - 2011 දරන අයවැය යෝජනාවට අනුව බදු චක්‍රලේඛ 7 පරිදි උපයන විට ගෙවන බදු වලට යටත් නොවන බව දන්වා සිටිමි.

එසේම විගණන වාර්තාවේ සඳහන් මහාචාර්ය (බාහිර) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් මහාචාර්ය මහින්ද විජේරත්න මහතා හට වැටුප් ගෙවීමේදී අත් වැරදීමකින් උපයන විට ගෙවීම් බදු අය කර නොමැති බව පිළිගන්නා අතර ඔහුගේ ඉදිරි වැටුප ගෙවීමේදී එම කාල සීමාවට අදාල උපයන විට ගෙවීම් බදු අය කර ගැනීමට කටයුතු කර ඇත.

2.4. <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

(අ) විශ්වවිද්‍යාල සේවකයින් හට භාෂා ප්‍රවීණතා දීමනාව ගෙවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 1996/14,1997/24 අනුව හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආයතන අංශය මගින් මීට අදාලව නිකුත් කර ඇති පත්වීම් ලිපි හා වැටුප් වර්ධක ලිපි මත පදනම්ව සිදු කර ඇති බව දන්වා සිටිමි.

එසේම අංක 2003/05 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව 2003.01.01 දිනෙන් පසුව බඳවාගත් සේවකයින් හට මෙම දීමනාව ලබා දී නොමැත. මේ සම්බන්ධයෙන් තව දුරටත් පැහැදිලි කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 08/2013 හා 2013.05.23 දිනැති චක්‍රලේඛය අනුව 2013 මැයි මස සිට මෙම දීමනාව ගෙවීම මුළුමනින්ම නතර කිරීමට කටයුතු කර ඇත.

(ආ). කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කරන අධ්‍යයන මණ්ඩලවල ලේකම් තනතුරේ සේවය කරන ආචාර්ය මණ්ඩලය මෙම ආයතනයේ බාහිර දේශකයකු ලෙස සපයන සේවාවට අමතරව අදාල අධ්‍යයන මණ්ඩලයේ ශිෂ්‍ය ලියාපදිංචියේ සිට උපාධිය පිරිනැමීම දක්වා සිසුන්ගේ අධ්‍යයන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම, අධ්‍යයන මණ්ඩල සඳහා ආචාර්ය මණ්ඩලය පත් කිරීම, අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වීම යනාදි වශයෙන් සිදු කරන කාර්ය භාරය සැලකිල්ලට ගෙන මුදල් කමිටුවේ හා අංක 174/5/6 දරන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ නිර්දේශය මත මසකට රු.1,000 බැගින් ගෙවීමට කටයුතු කර ඇත. එහෙත් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියට අනුව අධ්‍යයන මණ්ඩල ලේකම් දීමනාව ලෙස කළමනාකරණ මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන දීමනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්

අනුමත කර ගත යුතු බැවින් අදාල ඉල්ලීම මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කොට ඇත.

(ඇ). 2013 වර්ෂයේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සඳහා සම්බන්ධ වූ මාණ්ඩලික නිලධාරින්ට ගෙවීම් කිරීමේදී සාමාන්‍ය අනුමත පටිපාටිය වන නිවාඩු දින දීමනා සවස් කාලයේ සේවය කිරීම වෙනුවෙන් ලබා දිය නොහැකි බැවින් අදාල සමීක්ෂණ කාර්යයට සම්බන්ධ වූ නිලධාරින් හා අනෙකුත් සේවකයින් සඳහා අදාල කාර්යය වෙනුවෙන් ගතවන කාලය සැලකිල්ලට ගෙන අතිකාල හා නිවාඩු දින ගෙවීම්වලට සමාන ගෞරව දීමනාවක් (Honorarium Allowance) ගෙවීමට 2013.11.29 දින පැවති 203 දරන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කර ඇත.

**3. මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය කොට විගණන වාර්තාවේ පෙන්වා ඇති ප්‍රතිඵලයන් හා එකග වෙමි. සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂ වලට අදාලව සමුච්චිත අරමුදලට කර ඇති ගැලපීම් සම්බන්ධයෙන් අදාල ජර්නල් සටහන් මගින් පැහැදිලි කර ඇත.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

Crossing Boundaries පර්යේෂණ ව්‍යාපෘතියේ 2013.12.31 දිනට ඉතිරි ශේෂය වූ රු. 111,677.00 ක මුදල 2014 සැප්තැම්බර් 26 දින පැවති 27 වන මූල්‍ය කමිටුවේ හා 2014 නොවැම්බර් මස 28 දින පැවති 210 දරන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත ආයතනයේ පර්යේෂණ සඳහා පහසුකම් සැපයීමේ අරමුදලට (Research Facilittion Fund) ගැනීමට කටයුතු කර ඇත.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

(අ) 2014.03.19 දින පැවති 25 වැනි මුදල් කමිටු නිර්දේශයට අනුව 2013.12.31 දිනට පර්යේෂණ අරමුදල් ගිණුම් වල පැවති ශේෂය වූ 1,214,716.00 ක වටිනාකම tu wdh;k fj; wdmiq යැවීමට fyda wdh;kfha mrAfhaIK wruqo,g .ekSu සඳහා අදාල ආයතන වෙත දැනුම් දීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ආයතනයේ 2014.09.26 දින පැවති 27 වන මූල්‍ය කමිටුවේ නිර්දේශය මත හා 2014 නොවැම්බර් මස 28 දින පැවති 210 වන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත එම ශේෂයන් ආයතනයේ පර්යේෂණ සඳහා පහසුකම් සැපයීමේ අරමුදලට(Research Facilitation Fund) ගෙන ඇත.

(ආ). විගණන වාර්තාවෙහි සඳහන් කර ඇති ජාතික විද්‍යා පදනම මගින් අදාල ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ අරමුදලින් 2013.12.31 දිනට ඉතිරිව ඇති ශේෂය ලෙස සඳහන් කර තිබූ රු. 914,982.00 ක ශේෂය 845,982.00 ක් ලෙස නිවැරදි විය යුතුය. එසේම සමාලෝචිත වර්ෂය තුල මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය අඩු වීමට ප්‍රධාන හේතුව අදාල

ව්‍යාපෘතියට අත්‍යාවශ්‍ය උපකරණ සැකසීම සඳහා ටෙන්ඩර් පත් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් කැඳවනු ලැබුවද අදාල උපකරණය එකලස් කිරීමට අවශ්‍ය භාණ්ඩ එම සැපයුම්කරුවන් ලග නොතිබූ බැවිනි. කෙසේ වෙතත් තාක්ෂණික කමිටු නිර්දේශය මත වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවුම් ලබා ගෙන අදාල එකලස් කිරීමේ ද්‍රව්‍ය මිලදී ගෙන ඇති අතර 2014.07.07 දිනට අදාල ව්‍යාපෘති අරමුදලේ ශේෂය රු. 292,294.00 බව දන්වා සිටිමි.

4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි පාඨමාලා අත්පොත් 180 අලෙවි නොවූ තොගයක් ලෙස හඳුනාගෙන ඇත්තේ 2014.01.13 දින තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ වන අතර අදාල පාඨමාලා අත්පොත්ද ඇතුලුව හඳුනාගෙන ඇති අනෙකුත් භාවිතා නොකරන ලද ද්‍රව්‍ය සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි.

4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්

1979 අංක 9 දරන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියට අනුව මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනුබද්ධ ආයතනයක් ලෙස ස්ථාපිත කොට ඇත. එසේම මෙම ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒ සඳහා අවශ්‍ය අනුමැති විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවෙන් (LBMC) ලබා ගෙන ඇත. කෙසේ වෙතත් මීට පෙර විගණන වාර්තා වලින පෙන්වා දුන් පරිදි මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිතුමා වෙත ඉල්ලීමක් කර ඇත. එසේම පොදු කාරක සභාවේ නිර්දේශය පරිදි ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලය සතු බවට අවසන් ගිණුම් සම්බන්ධයෙන් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.2 හි හෙළිදරව් කර ඇත.

4.5. කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) විගණන වාර්තාව මගින් පෙන්වා දි ඇති පරිදි මේ වන විටත් මානව සම්පත් අයවැය ලේඛනයක් පිලියෙල කරමින් පවතින අතර එහි පිටපත් අදාල ආයතන වෙත යැවීමට ඉදිරියේදී කටයුතු කරමි.

(ආ). ඒ.ආර්.ඒ. මැද්දේගම මහතා- සම්බන්ධීකරණ නිලධාරි( කොන්ත්‍රාත් පදනම)
කේ. පී. ගුණසේකර මෙනවිය දේශක ( කොන්ත්‍රාත් පදනම)

ඒ.ආර්.ඒ. මැද්දේගම මහතා- සම්බන්ධීකරණ නිලධාරි( කොන්ත්‍රාත් පදනම)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත් කාර්ය මණ්ඩල ප්‍රතිපාදනයට (Cadre) ඇතුලත් තනතුරක් වන සම්බන්ධීකාරක තනතුර සඳහා

බඳවා ගැනීමේ පරිපාටිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරගෙන ඇති අතර ඒ අනුව සිදුකරන ලද විවෘත අයදුම්පත් කැඳවීමකින් තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කොට එහි නිර්දේශ කළමනාකරණ මණ්ඩලයට යොමු කොට එහි නිර්දේශය හා පාලක සභාවේ අනුමැතිය මත ඒ.ආර්.ඒ. මැද්දේගම මහතා උක්ත තනතුරට 2012..05.13 දින සිට බඳවා ගැනීමට කටයුතු කර ඇත. එසේම අදාල කොන්ත්‍රාත් කාලය වසරකින් දීර්ඝ කිරීම 2013.05.31 දින පැවති 200 වැනි කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය හා 2013.06.29 දිනැති පාලක සභාවේ අනුමැතිය මත සිදු කොට ඇත.

කේ. පී. ගුණසේකර මෙනවිය නිබන්ධක ( කොන්ත්‍රාත් පදනම)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත් කාර්ය මණ්ඩල ප්‍රතිපාදනයට (Cadre) ඇතුලත් තනතුරක් වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන උපයෝගී කරගෙන නිබන්ධක තනතුරට සුදුස්සෙකු බඳවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන තිබුණි. ඒ අනුව සිදුකරන ලද විවෘත අයදුම්පත් කැඳවීමකින් තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කොට එහි නිර්දේශ කළමනාකරණ මණ්ඩලයට යොමු කොට එහි නිර්දේශය හා පාලක සභාවේ අනුමැතිය මත කේ. පී. ගුණසේකර මෙනවිය උක්ත තනතුරට 2012..05.13 දින සිට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

කේ. වීරසූරිය මහතා රියදුරු (කාර්ය පැවරුම් මත)

ආයතනය විසින් මෑතකදී මිලදී ගත් වෑන් රථයද ඇතුළුව ධාවන මට්ටමේ පැවති වාහන සංඛ්‍යාව 4 ක් වුවද රියදුරු තනතුරු 2ක් පමණක් අනුමත වී තිබූ බැවින් අලුතින් තනතුරක් ඇති කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබුණි. අදාල තනතුරු ප්‍රතිපාදනයට අනුමතය ලබා දෙන තෙක් කාර්ය පැවරුම් පදනම මත රියදුරෙකු බඳවා ගැනීම සඳහා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කේ. වීරසූරිය මහතා කාර්ය පැවරුම් පදනම මත 2012.09.16 දින සිට බඳවා ගැනීමට කටයුතු කර ඇත

එසේම මෙම තනතුර සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල ප්‍රතිපදාන (Cadre) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත් අතර මෙම තනතුර ස්ථිරව පිරවීමට කටයුතු කරන තෙක් 2013.01.04 දින සිට අදාල බඳවා ගැනීම ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ හා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත සිදු කර ඇත.

5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1. <u>සංයුක්ත සැලැස්ම</u>

සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම වසර ආරම්භයේදීම පිලියෙල කරන ලදි. එහෙත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල පද්ධතිය සඳහාම වරින් වර සංයුක්ත සැලැස්ම පිලියෙල කිරීම සම්බන්ධයෙන් වැඩමුළු පවත්වා විවිධ සංශෝධන ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම ආයතනයේ අවසන් සංයුක්ත සැලස්ම 2013 වර්ෂයේ ජූලි මස පැවැත්වූ කළමනාකරණ කමිටු රැස්වීම වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. ඒ අනුව සකස් කරන ලද අවසන් සංයුක්ත සැලැස්ම අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

5.2. <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

ක්‍රියාකාරි සැලැස්ම තුල අන්තර්ගතව තිබූ ඉලක්ක. ඒවා ඉටුකර ගැනීම හා භාවිතා කරන ක්‍රමෝපායන් පිලිබඳව වරින් වර පැවති කලමණාකරණ කමිටු රුස්වීම් වලදී වසර පුරාම සාකච්ජා කරන ලදි. එසේ සාකච්ජාවට භාජනය කල කරුණු අතර සිසුන් සඳහා නිකුත් කිරීමට නියමිත ශිෂ්‍ය අත්පොත් මිලදී ගැනීම, විදේශීය සිසුන් බඳවා ගැනීම, නව පාඨමාලා පැවැත්වීම, ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, නව විභාග පටිපාටි හඳුන්වා දීම, ආයතනයේ පුස්තකාලය වැඩි දියුණු කිරීම, සිසුන් හා ආචාර්යවරුන්ගේ පර්යේෂණ මගින් නව සොයා ගැනීම් සමාජ ගත කිරීමට ආයතනයේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය පිලිබඳව මෙම රුස්වීම් වලදී නිරන්තරව සාකච්ජාවට බඳුන් කොට ඒ පිලිබඳව ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කරන ලදි. මෙම කමිටු වල න්‍යාය පත්‍රයට ක්‍රියාකාරි සැලැස්මට අදාල කරුණු ඇතුලත් කොට සාකච්ජා කිරීමෙන් අනතුරුව ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කරන ලදි. එසේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් වල සාරාංශයක් පහත දැක්වේ.

1. ආයතනයේ අධ්‍යයන පාඨමාලා වලට අනුව සංස්කරණය කරන ලද ශිෂ්‍ය අත්පොත 2012-2015 වර්ෂය දක්වා පිලියෙල කිරීම
2. පර්යේෂණ උපාධි සඳහා නව විභාග කමිටු පත් කිරීම හරහා පශ්චාත් උපාධි පාඨමාලාවල ගුණත්වය ඉතා ඉහල තත්වයකට ගෙන ඒම
3. පර්යේෂණ උපාධි ප්‍රධානය කිරීම පිලිබඳ ක්‍රියාවලිය පූර්ණ ලෙස සංශෝධනය කර නව ප්‍රමිතිකරණයක් සකස් කිරීම
4. ආයතනයේ මූල්‍ය ස්ථායිතාවය ඉහල නැංවීම සඳහා නව පාඨමාලා ගාස්තු ක්‍රමයක් සැකසීම
5. පාඨමාලා ගාස්තු අය කිරීම පිලිබඳ කියා පරිපාටිය සවිගැන්වීම මගින් වැඩි ආදායමක් ජනිත කිරීම.
6. ආයතනයේ භෞතික හා යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග - පැරණි ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම.
7. පන්ති කාමර/ දේශන ශාලා සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම වැඩි දියුණු කිරීම
8. සිසුන් හා ආචාර්ය මණ්ඩලය අතර ඉහළ අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැංවීම.

මෙම කරුණු පිලිබඳව ඉහත කමිටු වලදී සාකච්ජා කර ගනු ලැබූ තීරණ 2013 වර්ෂයේ පුරාවටම ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව ආයතනයේ කටයුතු බොහෝමයක් ක්‍රියාකාරි සැලැස්මට අනුව මෙහෙයවා ඇති අතර ඒවා ක්‍රියාවට නැංවීම පිලිබඳව සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් සමාලෝචිත වර්ෂයේදී අත් කර ගෙන ඇත. එසේම ඉදිරි කමිටු වලදී ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්කයන් හා අරමුණු ක්‍රියාත්මක කිරීම පිලිබඳව වැඩිදුරටත් සාකච්ජා කොට එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමට කටයුතු කරනු ලැබේ.

**5.3. අභ්‍යන්තර විගණනය**

(අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විශ්වවිද්‍යාලයේ, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ සහ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතුද සිදුකරන අතර සෑම වර්ෂයකම ඉහත ආයතන තුන සඳහා පිළියෙල කල අභ්‍යන්තර විගණන වැඩසටහන් විගණන කමිටුව වෙත ඉදිපත් කර නිර්දේශ ලබාගැනීමෙන් අනතුරුව උපකුලපතිගේ/ ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර ඇත.

(ආ) 2013 වර්ෂයේ ආයතනය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර ඇති අතර වර්ෂය තුලදී සිදුකල පරීක්ෂාවන් සඳහන් කාර්තුමය ප්‍රගති වාර්තාවන් පිළියෙල කර ඇත.

**5.4. අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛණය සකස් කිරීමෙන් පසුව නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් හා වේතන, විභාග ගාස්ත, පිළිතුරු පත්‍ර ඇගයීමේ ගාස්තු යන වියදම් ශීර්ෂවල වැඩිවීමක් සිදු වී ඇති අතර වර්ෂය තුල පාඨමාලා ගාස්තු හා අනෙකුත් ගාස්තු ඉහල දැමීම හේතුවෙන් ඊට අදාල ආදායම් ශීර්ෂ වලද අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි වීමක් සිදු වී ඇත. කෙසේ වෙතත් ඉදිරි වර්ෂ සඳහා අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී විශේෂ අවධානයක් යොමු කර විචලතාවයන් අවම වන පරිදි වඩා තාත්වික පදනමක් මත අයවැය ලේඛණය සකස් කිරීමට වග බලා ගනිමි.

**6. පද්ධති හා පාලනයන්**

සටහන් කරගතිමි. විගණන වාර්තාවේ පෙන්වා දී ඇති අංශ කෙරෙහි තව දුරටත් විශේෂ අවධානය යොමුකරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

**"ඔබගේ විගණන වාර්තාව සඳහා කරන ලද ඉහත දැක්වෙන සියළු පැහැදිලි කිරීම් නිවැරදි බවට මා විසින් පුද්ගලිකවම සහතික වෙමි."**

**අ/කලේ-මහාචාර්ය එස්.සමිත**
**අධ්‍යක්ෂ**
**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

පිටපත් - 1. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උප කුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය